# නියමුවා

ISSN 1391 - 1031 | 2026 සැප්තැම්බර් | 30 වෙළුම | 04 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/-

# කළු රාජ්‍යය මුලිනුපුටා දමා

## අනාගත පරපුරට යහපත් රටක් උරුම කරනවා

බුලත්සිංහල ජන රැලිය - 2026.09.06




**ලෝකය ඉදිරියේ ශ්‍රී ලංකාව බංකොලොත්, දූෂණයෙන් ගහන වූ කළු රටක් ලෙසට හංවඩු ගැසී තිබූ බවත් දරුවෙකුට ආරක්ෂාවක් නැති, අනාගතය පිළිබඳ විශ්වාසයක් නැති, නීතිය පිළිබඳ විශ්වාසයක් නැති විශාල කළු රාජ්‍යයක් රට තුළ ගොඩනැඟී තිබූ බවත් පෙන්වා දුන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා, දූෂිත කළු රාජ්‍යය මුලිනුපුටා දමා ජාතික ජන බලවේගය අනාගත පරම්පරාවට යහපත් රටක් උරුම කර දෙන බවට සහතික වූයේය.**

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 06වැනි දින 'අපේ ආණ්ඩුව: වසර දෙකයි - රටට සුබයි' තේමාව යටතේ බුලත්සිංහල මහජන ක්‍රීඩාංගණයේ පැවති මහා ජන රැලිය අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර කුමාර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

පහුගිය 2024 සැප්තැම්බර් මාසේ 21වෙනිදා මේ රටේ ජනතාව ඉතාමත් නිර්භීත තීන්දුවක් ගත්තා. ලංකා ඉතිහාසයේ පළමු වතාවට මුදල් බලය, මාධ්‍ය බලය හෝ දේශපාලන බලය රහිතව, මේ රටේ සාමාන්‍ය ජනතාව ඉදිරියට ඇවිත් තමන්ගේ මහජන බලය නියෝජනය කරමින් මේ ජනතාවාදී ආණ්ඩුව හදලා තියෙනවා. මේ ආණ්ඩුව පත් කළෙත් ජනතාව, මේ ආණ්ඩුව ඉස්සරහට ගෙනයන්නෙත් ජනතාව, මේ ආණ්ඩුව ආරක්ෂා කරන්නෙත් ජනතාවයි.

මේ රට මුළුමනින්ම පැවතියේ 'කළු රාජ්‍යයක්' විදිහටයි. හැමතැනම තිබුණේ කළු පැල්ලම්. දේශපාලනය කළු දේශපාලනයක්, ආර්ථිකය කළු ආර්ථිකයක්, නීතිය සහ විධායක ආධිපත්‍යය අයාලේ ගිය කළු නීතියක් බවට පත් වෙලා තිබුණා. සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර ගැටුම් ඇති කරවන ජාතිවාදී කළු සටන් පාඨ හැමතැනම පැතිරිලා තිබුණා.

අපි මේ කළු රාජ්‍යයේ ආර්ථිකය ඇතුළේ තිබුණු මහා පරිමාණ දූෂණ නතර කරන්න පටන් ගත්තා. මේ ස්ථාපිත කළු රාජ්‍යය හෙල්ලෙන්න පටන් ගන්නකොට, ඒ කළු රාජ්‍යයෙන් රැකවරණය ලබපු, ආරක්ෂාව ලබපු, වරප්‍රසාද ලබපු කට්ටිය දැන් හොඳටම කලබල වෙලා තියෙනවා. ඔය කවුරු කලබල වුණත් ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව කිසිදු කලබලයකට පත් වෙන්නේ නැහැ. අපි විශ්වාසය තබන්නේ ජනතාව මත පමණයි. අපේ බලයේ රහස තිබෙන්නේ ජනතාව ළඟයි. අපි ජනතාව දැනුවත් කරන්න ආවේ ඒ මහජන බලය තවදුරටත් ශක්තිමත් කරන්නයි.

ලංකාවේ ඉතාමත් අසීරුවෙන් උපයන ඩොලර් හොරෙන් පිටරට පන්නන කළු ආර්ථිකයක් තිබුණා. අපේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත්, රේගු දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා ඩොලර් කළු ආර්ථිකයෙන් එළියට පන්නන එක සම්පූර්ණයෙන්ම නතර කරලා තියෙනවා. භාණ්ඩාගාරයට එන ධනය අපි ඉතාමත් පරිස්සම් සහගතව පරිහරණය කරනවා. අපි නාස්තිය නතර කරලා මුදල් පරිස්සමෙන් වැය කළ නිසා අයවැය හිඟය විශාල ලෙස අඩු කරගන්න පුළුවන් වුණා.

අපි මෙලෙස එකතු කරගත් ධනය ගම් මට්ටමට, ජනතාව වෙත පහළට මුදා හරිනවා. ලබන වසරේ අයවැයෙන් අපි ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් ට්‍රිලියන 02ක් වෙන් කරනවා. ලංකා ඉතිහාසයේ කිසිම ආණ්ඩුවක් ප්‍රාග්ධන සංවර්ධන කටයුතු සඳහා මෙවැනි දැවැන්ත මුදලක් වෙන් කර නැහැ.

අපේ රටේ තිබුණු ඉතාමත් පිළිකුල් සහගත කළු දේශපාලනය අපි වෙනස් කළා. දේශපාලකයාට මිනිස්සු බය වෙලා හිටපු, දේශපාලකයා මහජන මුදල් නාස්ති කරපු සංස්කෘතිය අපි අවසන් කළා. පසුගිය වසර දෙකක කාලය තුළ ලංකා ඉතිහාසයේ පළමු වතාවට මහජන උද්ඝෝෂණයකට එරෙහිව එකදු කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල නොකළ, බැටන් පොල්ලක් පාවිච්චි නොකළ, වතුර ප්‍රහාර එල්ල නොකළ සාමකාමී වසර දෙකක් බවට පත් කිරීමට අපට හැකි වුණා.

නීතිය මුළුමනින්ම කඩා වැටී තිබූ හොරා පොලිස් සෙල්ලම අපි අවසන් කළා. හැබැයි ඔවුන් හිතුවේ නැහැ පිරිසිදු කණ්ඩායමක් ඇවිත් ඇත්තටම නීතිය ක්‍රියාත්මක කරයි කියලා. අද ඒ සෙල්ලම අවසන් වී සැබෑ ලෙසම නීතිය ක්‍රියාත්මක වෙනවා.

එදා කළු දේශපාලනයේ ප්‍රධානම මෙවලම වුණේ ජාතිවාදයයි. එදා බලයේ සිටි ආණ්ඩු දෙපැත්තටම සල්ලි දීලා ජාතිවාදී සංවිධාන හදලා, සිංහල-මුස්ලිම් ගැටුම් ඇති කරලා මිනිස්සු ඇන කොටා ගන්නා තත්වයට ඇද දමා තිබුණා. ජාතිවාදී ගැටුමක් මත කිසිදු පොලිස් පැමිණිල්ලක් වාර්තා නොවුණු වසර දෙක තමයි ජාතික ජන බලවේගයේ වසර දෙක. අපි ඒ ජාතිවාදී කළු දේශපාලනය මුළුමනින්ම පරාජය කර ජාතික සමගිය තහවුරු කර තිබෙනවා.

මේ කළු රාජ්‍යයේ භයානකම තැන තමයි කුඩු මත්ද්‍රව්‍ය සහ පාතාලය. එය කොපමණ වර්ධනය වී තිබුණාද කියනවා නම් රාජ්‍ය දේහයේ විශාල පංගුවක් පාලනය කිරීමට පාතාලයට හැකි වුණා. අපේ රටේ අනාගත පරම්පරාව වෙනුවෙන් මේ මත්ද්‍රව්‍ය රකුසා සහ පාතාලය අපි මේ රටින් සම්පූර්ණයෙන්ම තුරන් කරනවා. මත්ද්‍රව්‍ය සහ ඒ හා බැඳුණු පාතාලය සමඟ කෙළින්ම හැප්පෙන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පමණයි.


අපි ඒ වගකීම ඉටු කරන ගමන් රටේ අනාගත සංවර්ධනය සඳහා දැවැන්ත සැලසුම් රාශියක් ක්‍රියාත්මක කරමින් යනවා. හැම ව්‍යාපෘතියක්ම ක්‍රියාත්මක කිරීමට පෙර ඉතාමත් හොඳින් ශක්‍යතා අධ්‍යයනයක් කරලා, එයින් ජනතාවට ප්‍රතිඵල ලැබෙනවා නම් පමණක් අපි ප්‍රතිපාදන වෙන් කරනවා. අපි මෙතෙක් ආපු සාම්ප්‍රදායික ගමන් මඟ තීරණාත්මක ලෙස වෙනස් කර තිබෙනවා. ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ ඒ අලුත් වෙනසයි.

ජාතික ජන බලවේගයේ ප්‍රබලතම දේශපාලන ව්‍යාපාරය තවත් ශක්තිමත් කරමින් රට ගොඩනැඟීමේ මේ ඓතිහාසික ගමනට දායක වන ලෙස ඔබ සැමගෙන් ඉල්ලනවා.




### 03 අපි වැඩ කරන්නේ

අපිට අභියෝග වර්ග දෙකකට මුහුණ පාන්න සිද්ධ වුණා. එකක් දේශපාලන අභියෝග. අනික ස්වාභාවික විපත් හා ජාත්‍යන්තර යුද ගැටුම් විසින් නිර්මාණය කළ අභියෝග...



### 05 යල්පැන ගිය ප්‍රභූත්වය...

සමහර විපක්ෂ කණ්ඩායම්වල ප්‍රචාරක වැඩ රැස්වීම් දෙස බලන විට ඔවුන් පසුගිය කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ශෛලිය, හරයෙන් නොව පෙනුමෙන් කොපි කිරීමට උත්සාහ කරන බවක්ද ...



### 09 නන්දා මාලනී...

පවත්නා ක්‍රමය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට කැමැති දේශපාලන විවේචක බලකාය විසින් උලුප්පා දක්වන ලද දේශපාලන විරෝධාකල්පය විවේචනය විසින් යටපත් කරන ලද වැදගත් කොටස වන්නේ නන්දා විසින් ගැයූ ...





තරුණ.............................. 04
ජාත්‍යන්තර.......................... 06
ආර්ථිකය .......................... 07
කාන්තා............................. 08
විශේෂාංග.......................... 10
වේදිකාව............................ 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# ඖෂධ නිෂ්පාදන සංස්ථා සේවක වාර්ෂික සමුළුව මුළුදෙයි



රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා සේවක සංගමයේ වාර්ෂික මහ සමුළුව පසුගියදා පිළියන්දල ගල් බංගලාවේදී පැවැත්විණි. සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය හංසක විජේමුණි, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ජාතික කමිටු සාමාජික නීතිඥ ජානක අධිකාරී, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා සභාපති ආචාර්ය අජිත් ෂන්මුගනාදන් යන අයගේ ප්‍රධානත්වයෙන් පැවති සමුළුව සඳහා සංගමයේ ලේකම් ජගත් චන්‍ද්‍රසිරි සහෝදරයා ඇතුළු ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සංගම් සාමාජිකයෝ එක්ව සිටියහ.

# හේලීස් ෆැබ්‍රික් සේව්‍ය - සේවක ගැටලුවට විසඳුම්

සේවකයින් 2000කට අධික පිරිසක් සේවය කරන හොරණ - නෑබඩ පිහිටි හේලීස් ෆැබ්‍රික් ආයතනයේ පාලනාධිකාරය සහ සේවකයින් අතර පැවති ගැටලුවලට විසඳුම් ලබාදීමට පසුගියදා කම්කරු අමාත්‍යාංශයේදී කම්කරු නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ සහෝදරයා සමග පැවති සාකච්ඡාවකදී පියවර ගත් බව අන්තර් සමාගම් සේවක සංගමයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති පී. හෙට්ටිආරච්චි සහෝදරයා පවසයි.

සේවා මුර සම්බන්ධයෙන් හටගෙන තිබුණු එම ගැටලුව සම්බන්ධයෙන් දෙපාර්ශවය සමග කම්කරු අමාත්‍යාංශයේදී මෙම සාකච්ඡාව පැවැත්විණි. එම ආයතනයේ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර පැවති සම්මුතිය වෙනස් කරමින් නව සේවා මුර ක්‍රමයක් හඳුන්වා දී තිබිණ. එහිදී කම්කරු නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ සහෝදරයා ප්‍රකාශ කළේ උපරිම ඵලදායිතාවයෙන් සහ කාර්යක්ෂමතාවයෙන් නිෂ්පාදන කටයුතු සිදු කිරීමට නම් සේව්‍ය සේවක දෙපාර්ශවය අවබෝධයෙන් කටයුතු කිරීම වැදගත් බවයි.

ඒ මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට මනා පිටිවහලක් ලැබෙන බවද මහින්ද සහෝදරයා පෙන්වා දුන් අතර අනතුරුව දෙපාර්ශවයේම අදහස් සහ යෝජනා සලකා බලමින් මීට පෙර පැවති සේවා මුර ක්‍රමයට අනුව කටයුතු කිරීමට සියලු දෙනාගේ එකඟත්වය පළවිණ. මෙම අවස්ථාවට අන්තර් සමාගම් සේවක සංගමය නියෝජනය කරමින් ජයතිලක රණසිංහ සහෝදරයාද සහභාගි විය.

# EPF-ETF අරමුදල් ගැන බොරු ප්‍රචාරයන්ට හසුවෙන්න එපා

### කම්කරු ඇමතිවරු වෘත්තීය සමිති නියෝජිතයන්ට පවසති



වත්මන් ආණ්ඩුව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල විනාශ කිරීමට කටයුතු කරන බවට ඇතැම් පාර්ශව විසින් සිදු කරනු ලබන පදනම් විරහිත චෝදනා සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා විශේෂ කතිකාවක් කම්කරු අමාත්‍ය අනිල් ජයන්ත හා නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

සේ.අ.අ. සහ සේ.භා.අ. ඒකාබද්ධ කර තනි අරමුදලක් ස්ථාපනය කරන බවට එල්ල කරන චෝදනා පදනම් විරහිත බව පෙන්වා දුන් අතර අදාළ අරමුදල් වෙන වෙනම පවත්වා ගෙන යන අතරතුර ඒවායේ පරිපාලනය සහ කළමනාකරණය වෙනුවෙන් ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීම රජයේ අපේක්ෂාව වී ඇති බවද මෙහිදී සඳහන් කෙරිණි. ඒ සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පත්කරනු ලැබ ඇත.

# "වැඩ කරමු-රට හදමු අභිමානවත් සේවයක් ගොඩනගමු"

### ආයුර්වේද සුව සේවා සමුළුව කුරුණෑගලදී



සමස්ත ලංකා ආයුර්වේද සුවසේවා සංගමයේ ජාතික සමුළුව පසුගියදා වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේදී ළමා හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය නාමල් සුදර්ශන සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි..

මෙම සමුළුව සඳහා සමස්ත ලංකා ආයුර්වේද සුවසේවා සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය පී.ඩී.එන්.එස්.ජේ. බණ්ඩාර සහෝදරයා ඇතුළුව සංගමයේ සභාපති සහෝදරයා, වයඹ පළාත් ආණ්ඩුකාරතුමන්ගේ සම්බන්ධීකරණ ලේකම් මහනාම සහෝදරයා, වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස්තුමා, දිස්ත්‍රික් වෘත්තීය සමිති නිලධාරීහු සහ සාමාජිකයෝ සහභාගි වූහ.

# 22 ඉල්ලා අන්තරෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්



22 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහාය පළකරමින් එය සම්මත විය යුතු බවත් එය ජනතාවගේ යුක්තිය හා සාධාරණය ඉෂ්ඨවීමේදී අධිකරණය තුළ සිදුවන ප්‍රමාදයන් ඇතුළුව ගැටලුවලට විසඳුමක් වන බවත් ඒ හා සමානවම තවත් ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදුවිය යුතු බවත් අන්තර් සමාගම් සේවක සංගමය ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනුකරමින් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා පවසයි. මෙම සංශෝධනය සම්බන්ධයෙන් සමහරුන් වැරදි මතයක් සමාජ ගත කිරීමට උත්සාහ කළ බවත්, එමෙන්ම කිසිදු පදනමක් නොමැති නීති තර්ක ගෙන එන බවත් එමෙන්ම මෙය ඔවුන්ගේ උවමනාව ඇත්ත හොරු, ඇත්ත වංචාකාරයන් බේරීමේ වුවමනාව බවත් එබැවින් මෙම සංශෝධනය සම්මත කර ජනතාවට අදාළ සහනයන් සැලසීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින බවත් මෙහිදී ජානක අධිකාරී සහෝදරයා පැවසීය.

# දිට්වා හානිය මැකීමට ධීවර කර්මාන්තයට පහසුකම්

දිට්වා සුළි කුණාටුව නිසා ධීවර, ජලජ ජීවී සහ ඒ ආශ්‍රිත සමස්ත කර්මාන්තයට සිදුවී ඇති රුපියල් බිලියන 9497ක හානිය යථා තත්වයට පත්කිරීම සඳහා ක්‍රියාමාර්ග රැසක් දියත් කර ඇත.

ඒ වෙනුවෙන් ධීවර, ජලජ සහ සාගර සම්පත් ඇමති රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල යෝජනාව පසුගිය අගෝස්තු 03 දින සම්මත කර තිබේ. ඒ අනුව ජාතික ජල ජීවි වගා සංවර්ධන අධිකාරිය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව ඒකාබද්ධ මෙහෙයුමක් දියත් කිරීමට සැලසුම් කර ඇත. මෙම කර්මාන්තයේ විනාශ වූ සියලු යටිතල පහසුකම් නැවත නගාසිටුවීමට කඩිනම් ක්‍රියාමාර්ග අනුගමනය කෙරේ.

# මෙට්‍රෝ බස් සේවා තවත් පුළුල් කෙරේ

මගීන්ගේ ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දෙන ලද මෙට්‍රෝ බස්රථ සේවාව තවදුරටත් පුළුල් කරමින් පවත්වාගෙන යාම සඳහා බස් ඩිපෝ පහක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන ඇමති බිමල් රත්නායක සහෝදරයා මේ වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ යෝජනාව පසුගිය 10වැනි දින ඇමති මණ්ඩලයේදී අනුමත කරනු ලැබ ඇත. රුපියල් බිලියන 800ක වියදමින් ඒකල, තලංගම, කඩවත, රත්මලාන සහ හෝමාගම මධ්‍යම වැඩපළවල් එක්කර බස් ඩිපෝ පහක් ඇරඹීමට නියමිතය. නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දුන් මෙම බස් සේවාව මහජනතාවගේ ඉහළම ප්‍රසාදය දිනාගනිමින් ජනප්‍රිය වී තිබේ.

# මාතෘ සහ මුල් ළමා විය පෝෂණයට නව ව්‍යාපෘතියක්

ආර්ථික අර්බුදයට මෙන්ම කෝවිඩ් වසංගත තත්වයට මුහුණ දීමෙන් පසුව මාතෘ සහ මුල් ළමා විය පෝෂණ ඌණතාව උග්‍ර තත්වයට පත්වූ දිස්ත්‍රික්ක හතරක් වෙනුවෙන් විශේෂ ව්‍යාපෘතියක් දියත් කිරීමට ඇමති මණ්ඩල අනුමැතිය ලබාදී තිබේ.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය ඇමති වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව පසුගිය 10වැනි දින ඇමති මණ්ඩලය අනුමත කර තිබේ. නුවරඑළිය, රත්නපුර, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ගර්භණී හා කිරිදෙන මවුවරුන් මෙන්ම වයස අවුරුදු පහට අඩු දරුවන් වෙනුවෙන් විශේෂ පෝෂණ ව්‍යාපෘතියක් වසර තුනක් පුරා දියත් කිරීමට ඩොලර් මිලියන 2.73ක ලෝක බැංකු හා ජපන් ප්‍රදානයන් යොදා ගැනීමට නියමිතය.

# ඉදිරි පස්වසරටත් ජාතික ඖෂධ ප්‍රතිපත්තියක්

ශ්‍රී ලාංකික ජනතාවට දැරිය හැකි මිලක් ගෙවා ආරක්ෂාකාරී, ඵලදායී සහ ගුණාත්මක ඖෂධ ලබාදීමේ ක්‍රියාපටිපාටියක් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කෙරේ.

මෙම ජාතික ප්‍රතිපත්තිය 2026 - 2030 කාලය පුරා පවත්වාගෙන යාමට සැලසුම් කරනු ලැබ ඇත. ගෝලීය ඖෂධ වෙළඳපොළේ සිදුවන වෙනස්කම් සහ සැපයුම්දාම අභියෝග හඳුනාගනිමින් දේශීය නිෂ්පාදන පුළුල් කිරීමටත් මේ මගින් විශේෂ අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකා ජාතික ඖෂධ ප්‍රතිපත්තිය මෙයට පෙර 2020 - 2025 දක්වා වසර පහක් වෙනුවෙන් ක්‍රියාත්මක කර තිබිණි. ඉදිරි කාලය සඳහා වූ යෝජනාව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස පසුගිය 17වැනි දින ඇමති මණ්ඩලයට යෝජනා කරන ලදුව අනුමත කරනු ලැබිණි.

# ප්‍රාදේශීය සාහිත්‍ය කලා පුනරුදයකට සැලසුම්

සංස්කෘතික හා ජාතික උරුමයක් ආරක්ෂාකර ගනිමින් අනාගත පරම්පරාව වෙත දායාද කර දීම සඳහා ප්‍රාදේශීය කලාකරුවන් සවිබල ගැන්වීමේ පුළුල් සැලසුමක් ක්‍රියාත්මක කිරීමට සූදානම් කර තිබේ.

මේ වෙනුවෙන් ශ්‍රී ලංකා කලා මණ්ඩලය යටතේ පවතින ක්ෂේත්‍ර නවයක් කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. බහු සංස්කෘතික මධ්‍යස්ථාන වඩාත් ඵලදායී ලෙස යොදා ගනිමින් ප්‍රාදේශීය කලා උළෙලවල් සංවිධානය කිරීම ප්‍රමුඛතම ක්‍රියාමාර්ගයක් ලෙස තෝරාගෙන තිබේ. බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික ඇමති ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි සහෝදරයා මේ සම්බන්ධ කැබිනට් මණ්ඩල යෝජනාව පසුගිය 17 වැනි දින ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු සම්මත කර ගනු ලැබීය.

# ශ්‍රම වෙළඳපොළට සරිලන වෘත්තිකයන් බිහි කෙරේ

පාසල් අධ්‍යාපනය නිමා කරන තරුණ තරුණියන් තෝරා ගන්නා ක්ෂේත්‍රවලින් කාර්මික හා වෘත්තිය පුහුණුව ලබාදී මෙරට සහ ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළට සරිලන නිපුණතාවයෙන් යුත් තරුණ බලකායක් නිර්මාණය කිරීමට සැලසුම් කර ඇත.

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන ඇමතිනි අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය මේ සඳහා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල යෝජනාව පසුගිය 24වැනි දින අනුමත කරනු ලැබ ඇත.

ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශකත්වය මත 2026 - 2035 කාල සීමාව සඳහා මෙම වෘත්තිය පුහුණුව සැලසුම් කර තිබේ. "නිපුණතා සංවර්ධන පද්ධති පරිවර්තන වැඩසටහන" යනුවෙන් නම් කර ඇති මෙම සමස්ත පුහුණු පාඨමාලා විශේෂයෙන්ම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළේ ඉල්ලුම ඉලක්ක කර ගනිමින් සකස් කරනු ලැබ ඇත.

# පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සඳහා "ජන රිද්ම"

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341 ආවරණය වන පරිදි පුරවැසි කේන්ද්‍රීය පරිපාලන රාජ්‍ය සේවා සැපයීමක් වෙනුවෙන් "ජන රිද්ම" ව්‍යාපෘතිය හඳුන්වා දී තිබේ.

ප්‍රජා සංවර්ධනය, සමාජ ආරක්ෂණය, රජයේ ඉඩම් පරිපාලනය, ආපදා කළමනාකරණය, පුද්ගලයන් ලියාපදිංචි ප්‍රමාණය, විශ්‍රාම වැටුප් සම්බන්ධතා සේවාව සහ වෙනත් පුරවැසි කේන්ද්‍රීය කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර දීම වෙනුවෙන් "ජන රිද්ම" ව්‍යාපෘතිය හඳුන්වා දී ඇත. රාජ්‍ය පරිපාලන සහ පළාත් සභා සහ පළාත් පාලන ඇමති මහාචාර්ය චන්දන අබේරත්න සහෝදරයා මේ සම්බන්ධ යෝජනාව ඇමති මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසුව පසුගිය 24 වැනි දින සම්මත කරගනු ලැබීය.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ප්‍රතිලාභ වෙනුවට ප්‍රතිපත්ති උදෙසා වැඩ කිරීම

දැන් මාලිමාවේ ජනතාවාදී පාලනයට වසර දෙකක් සැපිරී තිබේ. ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ජාතික ජන බලවේගයට පැරණි පාලනය පරදා නව පාලනයක් බිහිකිරීමට හැකි වූයේ පෞද්ගලික ප්‍රතිලාභ වෙනුවෙන් වැඩ කරන දේශපාලන සංස්කෘතිය වෙනුවට ප්‍රතිපත්ති වෙනුවෙන් පොදු අරමුණක් වෙනුවෙන් කැපවෙන දේශපාලන සංස්කෘතියක් ඉතා දුෂ්කරතා මැද වුවද දිගු කලක් තිස්සේ පවත්වා ගැනීමට හැකිවූ නිසාය.

ජනතා විමුක්ති පෙරමුණ විසින් එහි ආරම්භයේ සිටම පවත්වාගෙන ආ පොදු අරමුණක් වෙනුවෙන්, නව සමාජයක් වෙනුවෙන්, සමාජ පරිවර්තනයක් වෙනුවෙන් කැපවීමේ මහන්සියෙන් වැඩ කිරීමේ වමේ දේශපාලන සංස්කෘතිය ජාතික ජන බලවේගය තුළද පැවතීම පසුගිය ජයග්‍රහණ සියල්ලේ පදනම විය. තමන්ට කිසිවක් පෞද්ගලිකව බලාපොරොත්තු නොවී පෞද්ගලික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් තොරව ඉතා දුෂ්කරතා මැද වැඩ කිරීම දුෂ්කර කාර්යයකි. තමන් ගෙවන සරල, චාම්, අල්පේච්ඡ ජීවිතය පිළිබඳ ප්‍රභූ දේශපාලන අතවැසියන් කරන නින්දා අපහාස දරා ගනිමින්, අරමුණ අත් නොහැර වැඩ කිරීම ඉතා දුෂ්කර දෙයකි. එම දුෂ්කර එහෙත් වටිනාම කාර්යය ඉටුකරමින් නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමට හා පවත්වාගෙන යාමට ජනතා විමුක්ති පෙරමුණ හා ජාතික ජන බලවේගය සමත්ව තිබේ.

මාලිමාවට බලය ලබා දීමේදී පුද්ගල චරිත කවුදැයි නොවිමසාම ජනතාව ඡන්දය දුන්නේ, බලය දුන්නේ මෙම දේශපාලන ව්‍යාපාරය තුළ තිබූ අනෙක් ප්‍රතිගාමී දේශපාලන කණ්ඩායම් තුළ දක්නට පවා නොතිබූ මෙම විශේෂ ගුණයන් නිසාය. එය වමේ ප්‍රගතිශීලී බලවේග විසින් පැරණි ප්‍රභූ දූෂිත දේශපාලනයට එල්ල කළ අභියෝගයක්ද වී තිබේ.

දැන් මාලිමා පාලනයට වසර දෙකක් පිරී ඉදිරියට යන විට මාලිමා පාලනය බිහිකිරීමට ජනතා විශ්වාසය ගොඩ නැගූ, ජාතික ජන බලවේගය අනෙක් පක්ෂවලින් වෙන්කර පෙන්වූ මෙම වමේ දේශපාලන සංස්කෘතිය තවදුරටත් අනවශ්‍ය වේද? නැත. එය පෙරටත් වඩා අවශ්‍ය වේ; පෙරටත් වඩා වැඩි ගුණයක් සහිතවම අවශ්‍ය වේ. ජාතික ජන බලවේගය නියෝජනය කරන ඊට සුබ පතන හා එය විශ්වාස කරන හැමදෙනාම අවධාරණය කර ගත යුතු කරුණ එයයි.

පොදුවේ ගත් කළ පක්ෂයක්, පක්ෂ කේඩරයක් තුළ බලය නොමැති කාලවල පවත්වාගෙන යන යම් විශේෂ ගුණාංග, බලය ගත් පසු පවත්වාගෙන යාම අසීරු වේ. ලෝකයේ ජාත්‍යන්තර දේශපාලන අත්දැකීම තුළද මෙය දැකිය හැක. බලය ලැබුණු පසු තම කාර්යභාරය අවසාන යැයි, සමහරු සිතන්නට පුළුවන. බලය ලැබුණු පසු තවදුරටත් කැපකිරීමේ පරිත්‍යාගයේ දේශපාලන ආදර්ශය අවශ්‍ය නොවෙනු ඇතැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. එහෙත් එය එසේ නොවේ.

ජනතාව වෙනුවෙන්, ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් නව සමාජයක් වෙනුවෙන් වමේ ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරයක් දශක ගණනාවක් මුළුල්ලේ කළ කැපකිරීමත් පරිත්‍යාග හා ආදර්ශයත් බලය ගත් පසු වඩ වඩාත් වැඩි ගුණයකින් යුක්තව අවශ්‍ය වේ. නැත්නම් නව සමාජයක් ගොඩනැගීම තබා ඒ ගැන සිතීමටවත් හැකි වන්නේ නැත. පැරණි සමාජයක් යළි ප්‍රතිනිර්මාණය කිරීම අතිශය දුෂ්කර බාධා පිරුණු එකක් වේ. එහිදී එම දුෂ්කරතා හා බාධා අභිබවා යා හැක්කේ සාමාන්‍ය දේශපාලන පක්ෂයකට නොව කැපකිරීම්, පරිත්‍යාගය, ධෛර්යයෙන් අභියෝගවලට මුහුණ දීම, ඉතාම දුෂ්කර මොහොතේ පවා අරමුණ අත්නොහැර සටන් කිරීම, පෞද්ගලික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් තොරව ජීවිත කාලය පුරාම මහන්සි වීම, ජනතාවට, රටට සැබෑ ලෙස ආදරේ කිරීම වැනි විශේෂ ගුණයන් සහිත දේශපාලන බලවේගයකට පමණි. මුළු මහත් දේශපාලන ඉතිහාසය අපට උගන්වා ඇති පාඩම එයයි.

මාලිමාවට ලබාගත් බලය ජනතාව ලබාදුන් ජනවරම සතුරන්ට ආපසු උදුරා ගැනීමට ඉඩ නොදී රැකගත යුතුය. ඒ කුමක් සඳහාද? ඒ, බලයේ සිටින අයට වරප්‍රසාද ලබා ගැනීමට නොවේ. මහජන මුදලින් සැප විඳීමටද නොවේ; බලය අයුතු ලෙස යෙදවීමටද නොවේ. ඒ, එම බලය උපයෝගී කර ගෙන සමාජය වෙනස් කිරීම සඳහාය. සහෝදර ජනතාවට, අනාගත පරපුරට 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' ලබාදීම සඳහාය. ලංකාව ජාතික පුනරුදයක් වෙත ගෙනයාම සඳහාය. එම භාරදූර කාර්යය ඉදිරි කාලයේ ඉටු කළ හැක්කේ මෙතෙක් ආ ගමන් මග තුළ අප පෙන්වූ කැපකිරීම, පරිත්‍යාගය, පෞද්ගලික ප්‍රතිලාභ නොතකා වැඩ කිරීම, දුෂ්කරතා හමුවේ නොසැලී සිටීම, සාමූහිකව සහෝදරත්වයෙන් වැඩ කිරීම, නිහතමානීව වැඩ කිරීම, අභියෝග, දුෂ්කරතා හමුවේ නොසැලීම වැනි දේශපාලන ගුණාංගයන් තවදුරටත් ශක්තිමත් කිරීමත් ඒවා ජනතාව තුළටත් කාන්දු කිරීමටත් කටයුතු කිරීම තුළය.

ආණ්ඩුවට වසර දෙකක් පිරෙන මේ මොහොතේ අපේ අධිෂ්ඨානය විය යුත්තේ එයයි.

# අපි වැඩ කරන්නේ ගැඹුරු සමාජ ආර්ථික පරිවර්තනයක් වෙනුවෙන්



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

***මේ සැප්තැම්බර් මාසයට ආණ්ඩුවට වසර දෙකක් පිරෙනවා. ගෙවුණු වසර දෙක පිළිබඳව ඔබට දැනෙන හැඟීම කුමක්ද?***

තනි වචනයෙන් කිවුවොත් සතුටුයි. අපි බලය ගත්තේ ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා කඩා වැටී තිබුණු රටක. ඒ වගේම වංචා දූෂණ පිරුණු අපරාධ රාජ්‍යයක් ක්‍රියාත්මක වූ රටක. පවුල්වාදය, ප්‍රභූත්වය රජ කරපු රටක. ගෙවුණු වසර දෙක තුළ මේ සියල්ලම සැලකිය යුතු ලෙස වෙනස් කරන්න ආණ්ඩුව සමත්වෙලා තියෙනවා. ආර්ථිකයේ මූල්‍ය විනය හදලා, වංචා දූෂණ නාස්තිය අවම කරලා, රාජ්‍ය ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කරලා, වැඩිම බදු ආදායම් එකතු කරපු කාලය බවට මේ කාලය පත්කර ගන්න පුළුවන් වුණා. මේ වසරේ ගෙවුණු මුල් මාස 5 තුළ අපේ රටේ මෑත ඉතිහාසයේ පළමු වරට අයවැය අතිරික්තයක් ඇති වුණා, රු. බිලියන 200ක. වැටුප් වැඩි කරා. ජනතාවට සහන ලබාදුන්නා. තිබුණු තත්වයට අනුව ඒව විශාල ඉදිරි පියවරවල්.

ඒ වගේම පැරණි මජර දේශපාලන සංස්කෘතිය වෙනස් කළා. දේශපාලනයේ වරප්‍රසාද අහෝසි කළා. ප්‍රභූ හා පවුල්වාදී දේශපාලනය වෙනස් කළා. අපරාධ රාජ්‍යයේ පාතාලය. මත්කුඩු ජාවාරම් ආදිය මර්දනයට පියවර ගත්තා. රටේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය තහවුරු කිරීමේ දිශාවට පියවර තිබ්බා. මේ සියල්ල එකතු කරාම වසර දෙකකදී සතුටු විය හැකි ගමනක් බාධක මැද ආණ්ඩුව ඇවිත් තියෙනවා.

***ආණ්ඩුව පටන් ගන්න කොටම විපක්ෂයේ ඉන්න අය කිවුවේ ආණ්ඩුවට වැඩි ආයුෂ නැහැ කියලා. මාස 3න්, මාස 6න් වැටෙනවා කිවුවා. මේ ගැන දැන් මොකද හිතෙන්නෙ.***

ඔව්. මේක රටම දන්න කාරණයක්. එක අතකින් පරාජය වෙලා විපක්ෂයට වැටුණු අයගෙ ප්‍රාර්ථනාව වුණේ ආණ්ඩුව ඉක්මනින් වැටෙන එක. අනෙක් අතට ඔවුන් ඇත්තටමත් ඒක විශ්වාස කළා. මොකද ඔවුන් විසින්ම නිර්මාණය කරල තිබුණ සමාජ ආර්ථික අර්බුදයේ ප්‍රමාණය ඔවුන් දැනගෙන හිටියා. මූල්‍ය අර්බුදයේ ගැඹුර ඔවුන් දැනගෙන හිටියා. ඒ නිසා ඔවුන් විශ්වාස කළා පෝලිම් ඇතිවෙලා. විදුලිය කපල ගෝඨාභයගේ කාලේ වගේ තත්වයක් ඇතිවෙයි කියලා. ඒත් ඔවුන්ට තේරුම් ගන්න බැරිවුණ දේ තමයි මේ බලය ගත්තේ ජාතික ජන බලවේගය කියන එක. ඕනෑම අභියෝග යකට මුහුණ දෙන්න පුළුවන් සැලසුමක්, වැඩපිළිවෙළක්, කැපවීමක්, ඇති දේශපාලන බලවේගයක් බලය ගත්තම සිදු කළ හැකි වෙනස්කම් ගැන ඔවුන්ට අවබෝධයක් තිබුණේ නැහැ. දැන් ඔවුන් ඒ අදහස අත්හැරල 2029 ගැන කතා කරනවා. ඒකම ආණ්ඩුව ලබපු ජයග්‍රහණයක්.

***ගෙවුණු වසර දෙක තුළ ආණ්ඩුවට අභියෝග ගණනාවකට මුහුණ පාන්න සිදු වුණා. ඒ පිළිබඳ ඔබේ අදහස කොහොමද?***

ඔව්. අපිට අභියෝග වර්ග දෙකකට මුහුණ පාන්න සිද්ධ වුණා. එකක් දේශපාලන අභියෝග. අනික ස්වාභාවික විපත් හා ජාත්‍යන්තර යුද ගැටුම් විසින් නිර්මාණය කළ අභියෝග.

අපි බලයට ඇවිල්ල පවතින ක්‍රමය වඩා යහපත් ප්‍රගතිශීලී පැත්තකට වෙනස් කිරීම ආරම්භ කළාම පැරණි ක්‍රමයට හුරුවුණු, ඉන් යැපුණු, ඉන් වාසි ලබාගත් පිරිස් හා පුද්ගලයන් අපට බාධා කළා. ඒ බාධා මැඩගෙන යාමේ අභියෝගය අපට තිබුණා. පරාජිත දේශපාලන නායකයො, ඒ අයගෙන් යැපුන අය, වංචා දූෂණ අල්ලස් මගින් වත්කම් උපයපු අය, නීති විරෝධි ව්‍යාපාර කරපු අය වෙන වෙනමත් එක අවබෝධයකිනුත් අපට බාධා කළා. බොරු කිවුවා, අවලාද ගැහුවා. වැඩ කඩාකප්පල් කරන්න උත්සාහ කළා. ඒවාට මුහුණ දෙමින් වැඩ කරන්න අපට සිදු වුණා.

උදාහරණයක් විදිහට ලංකාව දැඩි විදේශ මුදල් අර්බුදයක තිබිලා, අපි ක්‍රමානුකූලව විදෙස් වත්කම් වැඩිකරමින් යද්දි සමහර ජාවාරම්කාරයන් බැංකු අල්ලාගෙන අයථා ලෙස ඩොලර් රටින් පිට කළා. පසුගියදා පෞද්ගලික බැංකු 4ක කළමනාකාරවරුන් 4දෙනෙක් අත්අඩංගුවට ගත්තේ මේ අපරාධයට සම්බන්ධයි කියලා. ඔවුන් රටින් පිට කළ මුදල ඩොලර් බිලියනයක් පමණ බව කියනවා.

අනෙක් අතට අපට දිට්වා සුළි කුණාටුවට මුහුණ දීමට සිදුවුණා. ඉන් අපේ මහාමාර්ග හා දුම්රිය මාර්ග පද්ධතියට හා වාරිමාර්ගවලට විශාල හානි සිදු වුණා. ජනතාවගේ නිවාස විනාශ වුණා. ඉන් සිදුවුන පාඩුව දළ වශයෙන් ඩොලර් බිලියන 04ක් පමණ වෙනවා. ඒත් අපි ඒ ආපදාවට හොඳින් මුහුණ දුන්නා. විපතට පත් ජනයාට විශාල ලෙස වන්දි මුදල් ලබා දුන්නා.

ඒ වගේම මැද පෙරදිග යුදමය තත්වය නිසා ඉන්ධන මිල ඉහළ ගියා. ඒක අපිට විශාල ගැටලුවක් වුණා. තාමත් ඒක අවසන් නැහැ. අපි තෙල් වෙනුවෙන් වියදම් කළ ඩොලර් ප්‍රමාණය පස් ගුණයකින් ඉහළ ගියා. ඒත් ඒ මුළු බර අපි ජනතාවට පැටෙව්වේ නැහැ. ආණ්ඩුව ඉන් විශාල බරක් දැනටමත් දරා ගන්නවා. තාමත් හැම ඩීසල් ලීටරයකටම ආණ්ඩුව රු.100ක් දරනවා.

කොහොම උනත් අපි මේ අභියෝගයන්ට මුහුණ දුන්නා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නායකයින් ප්‍රසිද්ධියේම කිවුවා දැන් ලංකාවේ ආර්ථිකය ඕනෑම කම්පනයකට මුහුණ දීමට සමත් කියලා. රට හා රටේ ආර්ථිකය වසර දෙකක් තුළ ඒ මට්ටමට ගෙන ඒමට හැකිවීම ලොකු ජයග්‍රහණයක්.

***පැරණි මජර දේශපාලන සංස්කෘතියට ජනතාවගේ විශාල අකමැත්තක් තිබුණා. ඒක වෙනසක් කරන්න පසුගිය වසර දෙක තුළ ගත් පියවර මොනවාද?***

ඔව්. ජනතාව අපෙන් බලාපොරොත්තු වුන ප්‍රධානම කාරණය වුණේ පැරණි දේශපාලන සංස්කෘතිය වෙනස් කරන එක. අපි ඒ වෙනුවෙන් වෙන කිසිම ආණ්ඩුවක් නොකරන පියවර, ක්‍රියාමාර්ග රැසක් අරගෙන තියෙනවා.

අපි අපේ රටේ පළවෙනි වතාවට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හා විරුද්ධවාදීන්ගෙන් පළිගැනීමේ පැරණි ක්‍රමය මුළුමනින්ම නතර කළා. අපි පටන් ගත්තේ එතනින්. ඊළඟට රාජ්‍ය පාලනයට අපි කිසිම ඥාතියෙක් සම්බන්ධ කර ගත්තේ නැහැ. ඥාති සංග්‍රහය අවසන් කළා. පක්ෂ නායකයින්ට ආණ්ඩුවේ තනතුරු, උපදේශකකම් දෙන එක හා සාමාජිකයන්ට පමණක් රැකියා දීමේ ක්‍රමය අපි වෙනස් කළා. දැන් රැකියා දෙන්නේ සුදුසුකමට.

ඒ වගේම ඉහළින් සිදුවුණ වංචා, දූෂණ, හොරකම, මහජන මුදල් නාස්තිය නතර කළා. මැති ඇමතිවරුනට තිබුණු විශේෂ වරප්‍රසාද රැසක් අහෝසි කළා. ඒ අතර බදු රහිත වාහන බලපත්‍ර ලබාදීම නතර කිරීම. මන්ත්‍රී විශ්‍රාම වැටුප අහෝසි කිරීම විශේෂයි. දැන් ජනතාවට උඩින් ඉන්න ආරක්ෂකයෝ, රථ පෙරහැර පිරිවරා යන මැති ඇමතිවරු නැහැ.

ආණ්ඩුව විවේචනය කරන අයට අතීතයේ විශාල මර්දනයක් තිබුණා. අපි ඒකත් වෙනස් කළා. දැන් ආණ්ඩුව, ආණ්ඩුවේ නායකයන් විවේචනය කරන (සමහර විට අපහාස කරන) අය හොයාගෙන සුදු වෑන් එන්නේ නැහැ. මාධ්‍ය ආයතනවලට මාධ්‍යවේදීන්ට පහර දෙන්නෙ, ගිනි තියන්නේ නැහැ. එහෙම බැලුවම අපි දේශපාලන සංස්කෘතියේ විශාල ප්‍රගතිශීලී වෙනසක් ඇති කරලා තියෙනවා. ඒ වගේම දේශපාලනය වෙනුවෙන් ජාතිවාදය වැපිරීම අපි නතර කළා. ජාතිවාදී ගැටුම් නතර කළා. දැන් සියලු ජනතාව බියෙන් සැකෙන් තොරව ජීවත් වෙනවා. ඒ නිදහස කාටවත් ප්‍රතික්ෂේප කරන්න බැහැ.

***හොඳයි... මෙවැනි පියවර ගෙන තිබුණත් සමහර ප්‍රශ්න තවම තිබෙන බවටත්, සමහර ප්‍රශ්න විසඳීමේ ප්‍රමාදයක් පිළිබඳවත් ජනතාව මැසිවිලි නගනවා. මේ තත්වය දකින්නේ කොහොමද?***

ඔව් ඒක ඇත්ත. හැමදෙනාටම නැතත් සමහර ගැටලු පිළිබඳ සමහර ප්‍රදේශවල ජනතාව අතර යම් කනස්සල්ලක් තිබෙන බව ඇත්ත. මේක ස්වාභාවිකයි. අපේ රටේ දශක 07ක් තිස්සේ නිර්මාණය වුණු, නිර්මාණය කරපු සියලු ප්‍රශ්න වසර දෙකකින් විසඳලා අවසන් කරන්න බැහැ. ඒක ජනතාව දන්නවා. අපේ රටේ ජනතාවගේ ගැටලු විසඳීමට

> **මාර්ග පද්ධතිය දියුණු කිරීම, ප්‍රවාහනයේ නව විප්ලවයක් ඇති කිරීම, සෞඛ්‍ය සේවය දියුණු කිරීම, අධිකරණ පද්ධතිය දියුණු කිරීම, කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම වගේ ඉලක්ක එක්ක රටේ ගැඹුරු සමාජ ආර්ථික පරිවර්තනයක් වෙනුවෙන් අපි වැඩ කරනවා. දේශපාලකයන් වෙනුවෙන් නොව ජනතාව වෙනුවෙන් කැපවෙන පාලනයක් අපි බිහිකරලා තිබෙනවා.**

11 වැනි පිටුවට




# දූෂිතයින් හෙළිදරව් කිරීම...

දේශපාලනයේ දූෂිතභාවය පිළිබඳ කතාබහ එක් වකවානුවක බල ආධිපත්‍ය තුළ නිෂේධනය වනවා වෙනුවට, බලය ලබාග ැනීමේ උපකරණයක් ලෙස භාවිතා වූ බව අවිවාදිතය. නමුත් 2015 රාජපක්ෂ පාලනය බිදවැටීමට එය පාරාවළල්ලක් විය. එතැන් සිට දේශපාලනයේ දූෂිතභාවය සමජය ඉදිරියේ විවේචනයට හා අභියෝගට ලක්විය. 2022 දී දූෂිත දේශපාලකයින් හා ජනතාව හඳුනාගත් ඔවුන්ගේ භෞතික දේපළ ඉලක්ක වී පුපුරා ගියේ ඒ විරෝධයයි. දූෂණය තුරන් කිරීම, දූෂිතයින්ට දඬුවම් දීම වත්මන් ජනවරමේ ප්‍රධාන අභිලාෂයක් වීමටද එය හේතු විය.

දූෂිතයින් හා දූෂිත දේශපාලනය හෙළිදරව් වීම සිදුවන්නේ ඒ ජනතා අභිලාෂයන් ඉටුකිරීම වෙනුවෙනි. දැන් පැරණි දූෂිත දේශපාලනය කුමක්දයි සාක්ෂි සහිතව ඉතිහාසයේ ලියවෙමින් තිබීම නිසා ඔවුන්ට භූමියේ දේශපාලනය ඉතා අසීරු කෙරී ඇත.

එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ දූෂණ චෝදනා ලැබ ඇප පිට සිටින්නේ රාජ්‍ය මුදල් අවභාවිතාව සම්බන්ධයෙනි. එම පක්ෂයේම ලේකම් අකිල විරාජ් කාරියවසම් බන්ධනාගාර ගතව සිට දැන් ඇප පිට සිටින්නේ තම පුද්ගලික ඉන්ධන පිරවුම්හලේ සේවයට යෙදවූ සේවකයින්ට රජයේ මුදල් ගෙවීම මගින් සිදු කළ දූෂණයකට අදාළවයි.

සමගි ජන බලවේගයේ ආසන සංවිධායක චරිත් අබේසිංහ අත්අඩංගුවට පත්වන්නේ ප්‍රකට පාතාල නායකයෙකු වන හරක් කටාගෙන් කෝටි 12ක අල්ලසක් ලබාගැනීම සම්බන්ධවය. සමගි ජන බලවේගයේ වැලිගම සභාපති පසුගියදා ඝාතනය විය. ඔහුද මෙම අල්ලස් ගනුදෙනුවට සම්බන්ධයක් ඇති බව විමර්ශන නිලධාරීන් විසින් අනාවරණය කරගෙන ඇත.

එයාර්බස් ගනුදෙනුවේදී සිදු වූ බව කියන අල්ලස් ගනුදෙනුවේදී උපයා ගත් මිලියන 60ක මුදලක් පොදුජන පෙරමුණේ නායක මහින්ද රාජපක්ෂට ලබා දුන් බවට කපිල චන්ද්‍රසේන විසින් ලබාදුන් සාක්ෂියකට අදාළව විමර්ශන සිදුකෙරෙමින් ඇත. එසේම එම පක්ෂයේ අනාගත ජනාධිපති සිහිනය දකින නාමල් රාජපක්ෂද සිටින්නේ ඇප පිටය. එයින් එක් චෝදනාවක් වන්නේ ගුවන් සේවිකාවක් පුද්ගලික වුවමනාවන් වෙනුවෙන් යොදවාගෙන රජයේ මුදල් මාසිකව ලක්ෂ 42 බැගින් ගෙවා රජයට බරපතළ පාඩුවක් සිදුකිරීම􏰀ය.

එසේම හරක් කටාගෙන් කෝටි 12ක අල්ලසක් ලබාග ැනීමේ දෙවනි චූදිතයා වන්නේ හිටපු අධිකරණ ඇමතිවරයාගේ පුතා වන රබිත රාජපක්ෂය. මෙම අධිකරණ ඇමතිවරයා මෛත්‍රීපාල සිරිසේන, ගෝඨාභය රාජපක්ෂ හා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරු තිදෙනාගේම අධිකරණ ඇමති ධුර දරා තිබිණි.

එසේම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක් වන ශිරාන් බාසික්ගෙන් මුදල් ලබාගෙන නව දේශපාලන ව්‍යාපාර ආරම්භ කර ඇති බව අනාවරණය වෙමින් ඇත. මෙසේ දූෂිතයන් හෙළිදරව් වෙමින් ඇති මොහොතක ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාරවලට නිවැරදි, සුපිලිපන් දේශපාලනයක් ගැන කතා කිරීමට පවා නොහැකි ලෙසට බිම්මට්ටමේ දේශපාලනය බරපතළ කඩාවැටීමකට ලක් වී ඇත. එය තවත් තීව්‍ර වී ඇත්තේ අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම වෙනුවෙන් ආණ්ඩුව ගෙන ඇති පුළුල් ප්‍රතිපත්තිමය ප්‍රවේශය හේතුවෙනි.

දැන් මෙම පරාජිත බලවේග එම ප්‍රතිපත්තිමය තීරණ හා ක්‍රියාමාර්ග පසුපස හඹායමින් එම ක්‍රියාමර්ග අඩපණ කිරීමට අසාර්ථක උත්සාහයක නියැළෙමින් සිටිති. එම අසාර්ථක උත්සාහයන් පරාජයට පත්කරමින් ලැබුණු ජනවරමේ අපේක්ෂාවන් දිනවීම වෙනුවෙන් ක්‍රියාකාරී වීම, සංවිධානය වීම, අප කාගේත් වගකීම වන්නේය.

# අකුරු අතරින් පිපෙන ලෝකය...

පිටු අතර නිහඬව
අකුරු අවදිව
මනසට
දෙයි පියාපත්...
අවියකි,
ඇලපිලි, ඉස්පිලි, පාපිලි!
විඩාපත් ලොවක
අඳුර ඉරා හෙළන
මනුසත් හද ගැස්ම...
සුසුමකට,
කඳුළකට ඔබ්බෙන්
ඉගිලී යනු රිසි
ජනහඬට පණ දෙන
යුගයක පෙරළියකි
අකුරු...
අකුරු අහුරක්
වියළුණු හදක
යහලොවක බීජ..
බිඳ පැරණි ලොව පවුරු
නවලොවකට ඇරඹුමක්...
පොත් සුවඳින් පුරවා සිත්
මිනිසත්කම දකින,
කියවන..
රටක්, ජාතියක්
ගොඩනගමු අපි එක්ව..

(සාහිත්‍ය මාසය වෙනුවෙනි)



# අධිරාජ්‍යවාදයට අභියෝග කළ විප්ලවීය ආලෝකය ෆිදෙල්









සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කළ ෆිදෙල් කැස්ත්‍රෝ 100වැනි ජන්ම දින සැමරුම පසුගියදා කොළඹ පදනම් ආයතනයේදී පැවැත්විණි. එය ලෝකයේ අධිරාජ්‍යවාදී බලවේගවලට අභියෝග කරමින් ජනතාව කේන්ද්‍ර කරගත් සමාජයක් ගොඩනැගීමට උත්සාහ කළ කියුබානු විප්ලවයේ උරුමය නැවත කියවා බැලීමක් විය.

ෆිදෙල් කැස්ත්‍රෝගේ දේශපාලන ගමනේ මූලික හරය වූයේ සමාජ අසාධාරණයට එරෙහි අරගලයයි. 1959දී බැටිස්ටාගේ ඒකාධිපති පාලනය පෙරළා දැමූ කියුබානු විප්ලවය, හුදෙක් දේශපාලන බලය මාරු කිරීමකට සීමා නොවී පුළුල් සමාජ පරිවර්තනයක් බවට පත්විය. විශේෂයෙන්ම අධ්‍යාපනය, සෞඛ්‍යය සහ ජනතා සුබසාධනය ලාභය මත නොව මිනිසාගේ අයිතිවාසිකම් ලෙස සැලකීම එහි වැදගත් ලක්ෂණයක් විය.

විප්ලවයෙන් පසුව කියුබාව දැවැන්ත සාක්ෂරතා ව්‍යාපාරයක් දියත් කළේය. නොමිලේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා පුළුල් කිරීම මගින් දුප්පත් ජනතාවට දශක ගණනාවක් පුරා අත්‍යවශ්‍ය සේවා ලබාදීමට රජයට හැකි විය. ලෝකයේ බොහෝ රටවල සෞඛ්‍යය සහ අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩ බවට පත්වෙමින් තිබියෙදී, කියුබාව ඒවා ජනතාවගේ මූලික අයිතිවාසිකම් ලෙස රැකගැනීමට උත්සාහ කළේය.

ෆිදෙල්ගේ නායකත්වයේ තවත් සුවිශේෂී ලක්ෂණයක් වූයේ එක්සත් ජනපදයේ බලපෑමට එරෙහිව කියුබාවේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමයි. 1961 'බේ ඔෆ් පිග්ස්' ආක්‍රමණය පරාජය කිරීමත්, ඉන් පසුව දශක ගණනාවක් පුරා පැවති එක්සත් ජනපද ආර්ථික සම්බාධක මධ්‍යයේ රට පවත්වාගෙන යාමත්, ෆිදෙල්ගේ නායකත්වයේ ජාත්‍යන්තර දේශපාලන වැදගත්කම තවදුරටත් තහවුරු කළේය.

අද කියුබාව බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටියි. ඉන්ධන, ආහාර සහ ඖෂධ හිඟය, විදුලි කප්පාදු, නිෂ්පාදන ධාරිතාවේ දුර්වලතා සහ ජන ජීවිතයේ දුෂ්කරතා එරට ජනතාවට දැඩි බලපෑමක් එල්ල කර තිබේ. එහි බාහිර සම්බාධකවල බලපෑම මෙන්ම ආර්ථික කළමනාකරණයේ අභ්‍යන්තර ගැටලුද විසඳිය යුතුය.

එහෙත් දැඩි දුෂ්කරතා මධ්‍යයේ වුවද කියුබානු ජනතාව තමන් දිනාගත් ස්වෛරීභාවය සහ ජාතික අනන්‍යතාව අතනොහැර සිටිති. විප්ලවයේ උරුමය ආරක්ෂා කරගැනීම සහ තමන් විශ්වාස කරන සමාජ වටිනාකම් වෙනුවෙන් පෙනී සිටීම ඔවුන්ගේ දේශපාලන ඉතිහාසයේ තවදුරටත් වැදගත් කොටසකි.


ෆිදෙල් කැස්ත්‍රෝ සියවැනි ජන්ම සංවත්සරය අපට මතක් කරන්නේ එක් කරුණකි. එනම්, විප්ලවයක ජයග්‍රහණය බලය ලබාගැනීමෙන් අවසන් නොවන බවයි. එය ජනතාවගේ ජීවිතය යහපත් කිරීම, සමාජ සාධාරණත්වය රැකගැනීම සහ බාහිර ආධිපත්‍යයට එරෙහිව රටක ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා වූ අඛණ්ඩ අරගලයක් බවද එය නැවතත් සිහිපත් කරවයි.

එමෙන්ම කවරාකාරයේ දුෂ්කරතා මධ්‍යයේ වුවද තමන් පෙනී සිටින මතවාදය ආරක්ෂා කිරීමත්, තමන් විශ්වාස කරන නිදහස හා සමාජ සාධාරණත්වය වෙනුවෙන් අඛණ්ඩව පෙනී සිටීමත් පිළිබඳවද ෆිදෙල්ගේ දේශපාලන උරුමය අපට සිහිපත් කරයි.

ෆිදෙල් ආලෝකයක් වූයේ එකලට පමණක් නොවේ. ඔහුගේ දේශපාලන උරුමය අද ද විවාදයට, විග්‍රහයට සහ අධ්‍යයනයට ලක්වන අතර, ඔහුගේ භූමිකාව ලෝක දේශපාලනය තුළ විප්ලවීය ආදර්ශයක් ලෙස තවදුරටත් සාකච්ඡාවට බඳුන් වෙමින් ඇත.




## සීමාවාසික පුහුණුවේදී සොයා ගත් අලුත් ග්‍රහයා...



NASA හි සීමාවාසික පුහුණුවේ (internship) 'තුන්වන දිනයේදී'ම පෘථිවිය මෙන් 6.9 ගුණයක් විශාල ග්‍රහලෝකයක් සොයාගත් 17 හැවිරිදි තරුණයා වුල්ෆ් කුකියර් (Wolf Cukier) වේ. මෙම ග්‍රහලෝකය TOI 1338 b ලෙස නම් කරන ලද අතර වුල්ෆ් විසින් ඝී හි ගොඩාර්ඩ් අභ්‍යවකාශ පියාසැරි මධ්‍යස්ථානයේදී සූර්යග්‍රහණය වන ද්විමය තාරකා පිළිබඳ TESS දත්ත විශ්ලේෂණය කරමින් මෙම ග්‍රහලෝකය සොයා ගන්නා ලදී. ඔහුගේ පුහුණුව ආරම්භ වී පැය 72ක් වැනි කෙටි කාලයක් තුළදී, "විශේෂඥයින්ට" (සහ පරිගණක ඇල්ගොරිතමවලට) මග හැරුණු තාරකාවක ඉතා සියුම් වෙනසක් (flicker) ඔහුට නිරීක්ෂණය විය. එම සියුම් වෙනස හඳුනාගැනීමෙන් අනාවරණය වූයේ TOI 1338 b නම් දැවැන්ත ග්‍රහලෝකය පික්ටර් තාරකා මණ්ඩලයේ ආලෝක වර්ෂ 1,300ක් දුරින් පිහිටා ඇති බවය. මෙය 'සර්කම්බයිනරි' (circumbinary) ග්‍රහලෝකයක් වේ. එනම් එය තාරකාවක් වටා නොව තාරකා දෙකක් වටා කක්ෂගතව ගමන් කරයි.

## මෑතකදී සොයා ගත් අපූරු මන්දාකිණිය...



ආලෝක වර්ෂ මිලියන 650ක් පමණ ඈතින් පිහිටි PBC J2333.9–2343 නම් අපූරු මන්දාකිණියක් පිළිබඳව තාරකා විද්‍යාඥයින් විසින් මෑතකදී සොයාගෙන තිබේ. අතිවිශාල පැරණි රේඩියෝ ව්‍යුහයකින් යුත් මෙම මන්දාකිණියේ මධ්‍යස්ථානය, ඉතා ක්‍රියාකාරී බ්ලේසාර් (blazar) වර්ගයේ හරයකින් සමන්විත වේ. එහි ජෙට් ධාරාව සෘජුවම පාහේ පෘථිවිය දෙසට යොමු වී තිබීම විශේෂත්වයක් වේ. මෙම මන්දාකිණියේ දැවැන්ත රේඩියෝ ව්‍යුහය ආලෝක වර්ෂ මිලියන 04ක් පමණ (මෙගාපාර්සෙක් 1.2ක්) අභ්‍යවකාශයට විහිදී පවතී. පැරණි රේඩියෝ ලෝබ්ස් (radio lobes) සමඟ සැසඳීමේදී මෙම නව ජෙට් ධාරාවේ දිශාව විශාල ලෙස වෙනස් වී ඇති බව විද්‍යාඥයින් නිරීක්ෂණය කර ඇත.


## එංගලන්තයේ සූර්ය බලශක්ති නගරයක්...



අක්කර 900ක් පුරා පැතිරුණු දැවැන්තම "සූර්ය බලශක්ති නගරය" එංගලන්තයේ සුන්දර කෙන්ට් (Kent) ගම්බද ප්‍රදේශයේ පිහිටා ඇත. එහි තණබිම් අතර කොළපාටින් දිස්වනවා සේම හිරු එළියට දිලිසෙන, සූර්යය පැනල 800,000කට ආසන්න ප්‍රමාණයක් දක්නට හැක. මෙය Cleve Hill Solar Park ලෙස නම් කර ඇති විශාලතම සූර්ය බලශක්ති ව්‍යාපෘතියකි. මේ ව්‍යාපෘතියේ සමස්ත බලශක්ති නිෂ්පාදනය මෙගාවොට් 373ක් වේ. නිවාස 102,000කට ආසන්න බලශක්තියක් එනම් වසරකට සාමාන්‍ය නිවාස ලක්ෂයකට අධික ප්‍රමාණයකට අවශ්‍ය විදුලිය මෙයින් නිපදවෙයි. ඉර එළිය නොමැති රාත්‍රී කාලයටත්, විදුලි ඉල්ලුම උපරිම වෙන වෙලාවටත් භාවිත කළ හැකි මෙගාවොට් 150ක දැවැන්ත බැටරි පද්ධතියක් මෙහි පිහිටා ඇත. සූර්ය පැනල පමණක් නොව, පක්ෂීන් සහ ප්‍රදේශයේ සතුන් උදෙසා අක්කර 130කට වැඩි ප්‍රමාණයක් රක්ෂිත ප්‍රදේශයක් ලෙස වෙන්කරමින් 65%ක ජෛව විවිධත්ව වර්ධනයක් (Biodiversity Net Gain) අත්පත් කරගැනීමට සැලසුම් කර තිබීමත් මෙම ව්‍යාපෘතියේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි.

# යල්පැන ගිය ප්‍රභූත්වය හා

# ව්‍යාජ GEN - Z වරු





""පැරණි ක්‍රමයෙන් අප උරුමකොට ලබා සිටින පැරණි (ක්‍රම සහ) හුරු පුරුදු අනුබැඳියාව, නැතහොත්, ජනතාව අතර තදින් පැතිර තිබෙන පෞද්ගලික දේපළ හා සම්බන්ධ සිරිත් ඉවත ලනු වස් වැඩකරන පොදු ජනතාවට කරුණු අවබෝධ කර දීම සහ උපදෙස් දීම තම මූලික කර්තව්‍යය සේ සලකා අධ්‍යාපන කාරකවරුන් හා අරගලයේදී පෙරමුණු බල ඇණිය වන කොමියුනිස්ට් පක්ෂය කටයුතු කළ යුතුය."

**ලෙනින්**

**තෝ. කෘති, 09 වෙළුම, 77 පිටුව**

ලංකාවේ විපක්ෂය වැටී තිබෙන ගොඩ ආ නොහැකි අගාධය පිළිබඳ අපි මීට පෙරද ලියා ඇත්තෙමු. යළිත් ඒ ගැන ලිවීමට සිතුණේ මේ දිනවල පරාජිත සුන්බුන් විපක්ෂ කැලි නටන හා නටවන නාඩගම් නිසාය.

ලංකාවේ දූෂිත ප්‍රභූ පවුල්වාදයට එරෙහිව කලක් තිස්සේ මෝරමින් ආ විරෝධයත්, ජනතා උද්ඝෝෂණත් පුපුරා ගියේ 2022 ගෝල්ෆේස් අරගලයද නිර්මාණය වෙමිනි. එහි පාලකයන්ට තිබූ ප්‍රධානම චෝදනාව හා විරෝධය වූයේ ජනතාවට ඉහළින් දේශපාලකයන් වරප්‍රසාද ලැබීම හා ප්‍රභූත්වය නඩත්තු කිරීම පිළිබඳවය. ඒ සඳහා කරන නාස්තිය, වංචා, දූෂණ පිළිබඳවය. රාජපක්ෂවරුන්ට පවුල් පිටින් බලය අතහැර පසුබැසීමට සිදු වූයේ පවුල්වාදයට හා ප්‍රභූත්වයට එල්ල වූ විරෝධයේ බරපතළකම නිසාය. පසුගිය මහ මැතිවරණයේදී රාජපක්ෂ පවුලේ කිසිවෙකුට ඡන්දය ඉල්ලීමටවත් ධෛර්යයක් නොවූ අතර නාමල් රාජපක්ෂ මන්ත්‍රීකම බේරා ගත්තේ ජාතික ලැයිස්තුව තුළිනි.

එහෙත් දැන් එම රාජපක්ෂවරුන්ට ජනතාව තමන්ව සිංහාසනවලින් මහ පොළොවට ඇද දමා එලවා දැමූ බව අමතක වී තිබේ. තමන් දේශපාලනයෙන් ප්‍රතික්ෂේප වූයේ පවුල්වාදය හා ප්‍රභූ දේශපාලනය නඩත්තු කිරීමට කටයුතු කළ නිසා බව අමතකව තිබේ. මෑතම අතීතයෙන් හෝ පාඩම් ඉගෙන ගන්නවා වෙනුවට රාජපක්ෂලා ඇතුළු හිටපු ප්‍රභූ නඩ, යළිත් පරණ නාඩගමම නැටීමට පටන්ගෙන තිබේ. ඒ සඳහා නාමල් රාජපක්ෂ GEN - Z එකටත් නිගා කරන, වැඩවසම් අදහස්වලින් ඔළු පුරවා ගත් තරුණියන් දෙතුන් දෙනෙක් වේදිකාවලට ගොඩකරගෙන ඇත. තරුණ තරුණියන් දෙතුන් දෙනෙකු යොදාගෙන යළි ප්‍රභූත්වය ගොඩනැගීමට උත්සාහ කරනු පෙනේ.

යුරෝපයේ පැවති වැඩවසම් ප්‍රභූ දේශපාලනය අවසන් වූයේ 16වැනි 17වැනි සියවස්වල ඇති වූ ධනේශ්වර ක්‍රමයේ නැගීම හා ධනේශ්වර විප්ලවයත් සමගය. ඒ අනුව ධනවාදයට පවා ප්‍රභූ පවුල්වාදය ගැලපෙන්නේ නැත. එහෙත් ලංකාවද ඇතුළු පසුගාමී ආසියාතික රටවල් කිහිපයක බලය ප්‍රභූ පවුල් අතම තබාගෙන තිබුණි. ඒ, ජනතාවගේ පරාධීන, යටහත් මනෝභාවයන් උපයෝගී කර ගනිමින් හා එම මනෝභාවයන් නඩත්තු කරමිනි.

ලංකාවේ ධනවාදයට පදනම දැමූ බ්‍රිතාන්‍යයෝ ලංකාවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් ඉටු නොකළ අතර, පැරණි ආසියාතික ප්‍රභූ පාලනයේ නෂ්ටාවශේෂ ඉතිරි වන්නට ඉඩ හැරියහ. ඉන් නතර නොවී ප්‍රභූ පවුල් අතටම බලය ලබා දෙමින් රටට ඊනියා නිදහස ලබා දුන්හ. එම ප්‍රභූ පවුල් පාලනයේ වර්තමාන නායකයන් වූයේ රාජපක්ෂවරු හා රනිල් වික්‍රමසිංහලාය. සජිත් ප්‍රේමදාසද තමන්ට පරම්පරාවෙන් අයිති නැති වුවත් ප්‍රභූත්වයටම ඇන්දේය. මෙරට ජනයා මීට වසර දෙකකට පෙර පරාජය කරනු ලැබූයේ මේ ප්‍රභූ දේශපාලනය හා දූෂිත පවුල්වාදයයි.

දැවැන්ත පරාජයකින් පසු යළි ජයග්‍රහණය කරා යාමට නම් දේශපාලන සංවිධාන, ඒවායේ නායකයන් තම පරාජයේ හේතු පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කළ යුතුය. නව තත්වයන්ට අනුව වෙනස් විය යුතුය. පරාජයට හේතු වූ කරුණුවලින් මිදිය යුතුය. එහෙත් දේශපාලන දැනුමක් නැති, පවුල්වාදයේම ප්‍රතිඵලයක් ලෙස 'නායකයෙකු' වූ නාමල් රජපක්ෂ වැන්නන්ට එවැනි අවබෝධයක් නැති බව ඉතා පැහැදිලිය. ඒ නිසාම පැරණි ක්‍රමයම අනුගමනය කරමින් යළි බලය ගැනීමට හැකිදැයි උත්සාහ කරනු පෙනේ. ඛේදවාචකය එයයි.

පුද්ගල චරිත පිම්බීම, ආසියාතික ප්‍රභූවාදය නඩත්තු කිරීම හා තම පියාවම කොපි කිරීම හැර නාමල්ටත්, තම පියාගේ නාමයේ සරණ යාම හැර සජිත්ටත් අලුත් දේශපාලනයක් නැත; අලුත් දේශපාලන කියවීමක් නැත; නව පරපුරේ දේශපාලන අභිලාෂයන් හා ඔවුන් සිතන විදිහ පිළිබඳ මෙලෝ අවබෝධයක් නැත; අප ජීවත්වන නූතන යුගය ගැන කිසිදු කියවීමක් නැත. එහෙත් රටට පෙන්වීමට නව පරපුරේ යැයි පෙන්වන, ඔවුන්ට ආවඩන තරුණ තරුණියන් කිහිපදෙනෙක් ප්‍රචාරක වැඩට යොදාගැනෙමින් ඇත. ඔවුන්ගේ හැසිරීම හා අදහස් GEN - Z පරපුරට නොව 20වැනි සියවසටද අයත් නැති පැරණි ආසියාතික පසුගාමිත්වයේ අදහස්ය. නාමල් රාජපක්ෂට පියා මෙන් උඩුරැවුල වවන්න යැයි තරුණියන් ආරාධනා කරන්නේ මේ නිසාය. එම තරුණියට අවශ්‍ය උඩුරැවුල සහිත ප්‍රතාපවත් ප්‍රභූ චරිතයක් මිස නූතන අභියෝග දිනීමට සමත් දැනුමක් හා උපාය උපක්‍රම දන්නා සරල නායකයෙක් නොවේ. එවැනි අය ළංකරගෙන ඔවුන් ලවාම තම ප්‍රභූත්වය යළි යළිත් පවත්වාගෙන යාමේ ආශාවෙන් පෙළෙන නාමල් රාජපක්ෂලාට වර්තමාන දේශපාලන බිමේ, ජය ගැනීමට නොව ඒ ගැන සිතීමට පවා නොහැක. ඒ තරම්ම ඔවුන් මතවාදීව දිළිඳුය; පසුගාමීය; අතීතය මතම ජීවත් වන අයය.

තම වේදිකාවලට තරුණ තරුණියන් නංවාගෙන ඔවුන් ලවා තමන් වර්ණනා කර ගැනීම විපක්ෂ කණ්ඩායම්වල අලුත්ම මෝස්තරය වී තිබේ. දේශපාලනයට තරුණ තරුණියන්ගේ පැමිණීම ඉතා හොඳ ප්‍රවණතාවයකි. එහෙත් විපක්ෂයේ කණ්ඩායම් වේදිකාවට නංවා ගන්නා අයට දේශපාලන වශයෙන් අවබෝධයක් නැත. ඔවුන් සමාජ දැනුමද නැති පෞද්ගලික වාසි වෙනුවෙන් තම නායකයාට ප්‍රශස්ති කියන අයය.

සමහර විපක්ෂ කණ්ඩායම්වල ප්‍රචාරක වැඩ රැස්වීම් දෙස බලන විට ඔවුන් පසුගිය කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ශෛලිය, හරයෙන් නොව පෙනුමෙන් කොපි කිරීමට උත්සාහ කරන බවක්ද පෙනේ. ජනතා විමුක්ති පෙරමුණු දේශපාලනයට ඒ තුළ තරුණ තරුණියන් කරන ලද කැපකිරීමට, ඔවුන්ගේ වටිනා අරමුණුවලට අහලකටවත් ළඟා විය නොහැකි, ඒ ගැන වැටහීමක් පවා නැති, සමහරු ජනතා විමුක්ති පෙරමුණේ වැඩ රටාව පෙනුමෙන් කොපි කිරීමට යාම හාස්‍යයකි.

ඒ කෙසේ වුවත් විවිධ සළුපිළි අන්දවා, පෙනුම වෙනස් කිරීමට උත්සාහ දැරුවත්, තරුණ ළමයි කිහිපදෙනෙක් ලවා හරයක් නැති දේ වේදිකාවල පවසමින් 'වෙනසක්' පෙන්වීමට උත්සාහ කළත් රාජපක්ෂවරුන් ඇතුළු විපක්ෂ කණ්ඩායම් තවමත් කටයුතු කරමින් සිටින්නේ රටත් ජනතාවත් ප්‍රතික්ෂේප කළ දේශපාලන ක්‍රමය තුළමය.

මේ තත්වය සැබැවින්ම මාලිමා ආණ්ඩුවට අභියෝගයක් නොව දේශපාලන වාසියකි. දුර්වල විපක්ෂයක් තිබීම, ප්‍රතිපත්ති නැති විපක්ෂයක් තිබීම, නව තත්වයන්ට හැඩ ගැසීමට අසමත්, අතීතය තුළ ජීවත් වන, ප්‍රභූත්වය වර්තමානයට ගලපා ගැනීමට උත්සාහ කරන, විපක්ෂයක් තිබීම ආණ්ඩුවට වාසියකි. එහෙත් රටට ඉන් වැඩක් නැත. ඒ පසුපස යන තරුණ පරපුරේ කිහිපදෙනා ගැන සිතෙන්නේ දුකකි. දැන් රටට අවශ්‍ය පුළුල් දේශපාලන සංවාදයකි. නව ආර්ථික උපායමාර්ග ගැන ලෝක දේශපාලනයේ නව ප්‍රවණතා ගැන, නව විද්‍යාත්මක දැනුම යොදා ගන්නා ආකාරය ගැන, සමාජ සාධාරණත්වයේ හා සමානතාවය පිළිබඳ, මිනිස් අයිතිවාසිකම් පිළිබඳ සංවාදයකි. එහෙත් ඊට දායක විය හැකි විපක්ෂයක් ලංකාවේ නැත. ලංකාවේ වත්මන් විපක්ෂයට හිමි තැන අන් කිසිවක් නොව ඉතිහාසයේ කුණු කූඩය බව ඉතා පැහැදිලිය.

**විවිධ සළුපිළි අන්දවා, පෙනුම වෙනස් කිරීමට උත්සාහ දැරුවත්, තරුණ ළමයි කිහිපදෙනෙක් ලවා හරයක් නැති දේ වේදිකාවල පවසමින් 'වෙනසක්' පෙන්වීමට උත්සාහ කළත් රාජපක්ෂවරුන් ඇතුළු විපක්ෂ කණ්ඩායම් තවමත් කටයුතු කරමින් සිටින්නේ රටත් ජනතාවත් ප්‍රතික්ෂේප කළ දේශපාලන ක්‍රමය තුළමය.**

# හරිත බලශක්ති තරඟයට මැදිවුණු ලිතියම් ත්‍රිකෝණය

වර්තමාන මානව සමාජය සිය බලශක්ති අවශ්‍යතාවයෙන් 80%ක් පමණ සපයාගනු ලබන්නේ පොසිල ඉන්ධන මගිනි. එහෙත් පොසිල ඉන්ධනවල කාබන් දහනය මගින් සිදුවන පරිසර හානිය අවම කිරීමටත්, ඉතා මෑත අනාගතයේ මතුවිය හැකි පොසිල ඉන්ධන අවසන් වීමට පිළිතුරක් ලෙසත් 'හරිත බලශක්ති ප්‍රභව' වෙත අද ලෝකයේ අවධානය හිමිව ඇත. සූර්ය ශක්තිය, සුළං ශක්තිය, ජල විදුලිය, මුහුදු රළ ශක්තිය වැනි ස්වභාවිකව නැවත නැවත ජනනය වන, පරිසර හානිය අවම මෙම 'හරිත බලශක්ති ප්‍රභව' භාවිතා කිරීමේදී මතුවන ප්‍රධානම ගැටලුව වන්නේ එම ශක්තිය ගබඩා කරගැනීමේ ඇති ගැටලුවයි. මෙම ප්‍රභවයන් සියල්ල අපට පාලනය කළ නොහැකි, අවිනිශ්චිත ඒවා බැවින් (සූර්ය ශක්තිය ලැබෙන්නේ දහවල් කාලයේ පමණක් වීම වැනි) හරිත බලශක්තිය ප්‍රචලිත වීමට නම් ඒවා ගබඩා කරගැනීමේ හැකියාවද පුළුල් විය යුතුය.




වර්තමානයේ එලෙස ශක්තිය ගබඩා කරගන්නා බැටරි සෑදීමට වඩාත් ප්‍රයෝජනයට ගන්නා මූලද්‍රව්‍යය වී ඇත්තේ ලිතියම් වේ. ලිතියම් යනු සොබාදහමේ ඇති සැහැල්ලුතම ලෝහයයි. එම නිසා කුඩා ඉඩක, අඩු බරකින් යුක්තව වැඩි ශක්තියක් ගබඩා කරගැනීමේ හැකියාව ලිතියම් සතුව ඇත. එමෙන්ම වඩා පහසුවෙන් නැවත නැවත ආරෝපණය කිරීමේ හැකියාවත් ලිතියම් සතුව පවතින නිසා වර්තමානයේ දුරකතන, පරිගණක වැනි බොහෝ ඉලෙක්ට්‍රොනික උපාංග සඳහාද ලිතියම් බැටරි භාවිතා වේ.

වර්ෂ 2000දී ලොව ලිතියම් නිෂ්පාදනය ටොන් 15,000ක් පමණ විය. 2010දී එය ටොන් 28,100කි. ඉන් අනතුරුව 2018දී ටොන් 85,000ක්, 2021දී ටොන් 106,000ක්, 2023දී ටොන් 180,000ක් දක්වා වැඩි වූ එය වර්තමානයේ ටොන් 2,50,000ක පමණ දක්වා වැඩිවී ඇත. තාක්ෂණ පරිවර්තනයන් සමග ලිතියම් ඉල්ලුම වැඩිවෙද්දී එහි මූල්‍ය වටිනාකමද වේගයෙන් ඉහළ ගොස් ඇත. එම නිසා වර්තමානයේ ලිතියම් හැඳින්වෙන්නේ 'සුදු රත්තරන්' යන නාමයෙනි. (සුදු පැහැ කුඩක් ලෙස දිස්වන නිසා)

වර්තමාන ලෝකයේ ලිතියම් නිෂ්පාදනයේ ප්‍රමුඛයා වන ඕස්ට්‍රේලියාව සමස්ත ලෝක නිෂ්පාදනයෙන් 50ක් ලබාදෙයි. චිලිය 25-30%ක්, චීනය 12-15% සහ ආර්ජන්ටිනාව 6-8%කින් දායකත්වය ලබාදේ. ලෝකයේ විවිධ ප්‍රදේශවලින් නිස්සාරණය කරන ලිතියම් ආනයනය කර පිරිපහදු කරමින් ලොව ප්‍රමුඛස්ථානයට පත්ව ඇත්තේ චීනයයි. එය ලෝකයේ සමස්ත ලිතියම් පිරිපහදුවෙන් 60-70% ක් පමණ වේ. එහෙත් ලොව වැඩිම ලිතියම් නිධි පවතින්නේ බොලීවියාව සතුවයි. එය දැනට ලොව සොයාගෙන ඇති ලිතියම් නිධිවලින් 22% පමණ වේ. මීට අමතරව ආර්ජන්ටිනාව 20%ක්, එක්සත් ජනපදය 13%ක්, චිලී 11% ක් ලෙස ලිතියම් නිධි හිමිකාරීත්වයෙන් පෙරමුණ ගෙන සිටී. මේ අනුව ලොව සමස්ත ලිතියම්වලින් 55-60%ක් පමණ අයත්වන්නේ 'ලිතියම් ත්‍රිකෝණය' ලෙස හඳුන්වනු ලබන බොලීවියාව, ආර්ජන්ටිනාව සහ චිලී ආශ්‍රිත කලාපයට වේ.

'කළු රත්තරන්' ලෙස හැඳින්වෙන බොරතෙල් නිධි පිහිටීම නිසා 20වන සියවසේදී මැදපෙරදිග කලාපයට ජාත්‍යන්තර දේශපාලනයේ ඇති වූ අවධානයට සමාන ආකාරයේම අවධානයක්, අනාගත ලෝකයේ බලශක්ති ආධිපත්‍ය හිමි 'සුදු රත්තරන්' පිහිටි ලිතියම් ත්‍රිකෝණයට වර්තමානයේ ලැබෙමින් ඇත. විශාලතම ලිතියම් නිධි මෙම කලාපය සතුව පැවතීමත්, එම නිධි බොහොමයක් තවමත් නොඉඳුල්ව පැවතීමත් ලෝක බලවතුන්ගේ අවධානය මෙම කලාපය වෙත ලැබීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

මෙම කලාපයට අයත් රටවල් අතුරින් බොලීවියාව යනු වැඩිම ලිතියම් නිධි හිමිකාරිත්වය ඇති රට වූවද එම ලිතියම් මහා පරිමාණ ලෙස නිස්සාරණය කරගැනීම සඳහා මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැත. එහෙත් ලිතියම්වල මූල්‍ය වටිනාකම සහ තරගකාරිත්වය ඉහළ යාම නිසා බොලීවියාව තමන්ගේ ලිතියම් නිස්සාරණය සම්පූර්ණයෙන් රාජ්‍ය සතු කර ඇත. (මෙම කලාපයෙන් පිටත පවතින මෙක්සිකෝවද මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇත.) එමෙන්ම චිලී රාජ්‍යයද පුද්ගලික හෝ විදේශීය සමාගම් ලිතියම් නිස්සාරණය කිරීමේදී රාජ්‍ය හවුල්කාරීත්වය අනිවාර්ය කර ඇත. වත්මන් ලෝක දේශපාලනය තුළ මෙම ප්‍රවණතාවය 'ලිතියම් ජාතිකවාදය' ලෙසද හැඳින්වේ. චිලිය තම ලිතියම් නිධි පුද්ගලික අංශයේ සහ විදේශීය ආයෝජන සඳහා ලබා දී ඇත. ලිතියම් නිෂ්පාදනය අතින් ලොව දෙවන ස්ථානය ඔවුන් හිමිකරගෙන ඇත්තේ එමගිනි. ආර්ජන්ටිනාව වර්තමානයේ ලිතියම් නිස්සාරණය වේගවත් කරමින් වේගයෙන් ඉදිරියට පැමිණෙමින් සිටියි.

> 'කළු රත්තරන්' ලෙස හැඳින්වෙන බොරතෙල් නිධි පිහිටීම නිසා 20වන සියවසේදී මැදපෙරදිග කලාපයට ජාත්‍යන්තර දේශපාලනයේ ඇති වූ අවධානයට සමාන ආකාරයේම අවධානයක්, අනාගත ලෝකයේ බලශක්ති ආධිපත්‍ය හිමි 'සුදු රත්තරන්' පිහිටි ලිතියම් ත්‍රිකෝණයට වර්තමානයේ ලැබෙමින් ඇත. විශාලතම ලිතියම් නිධි මෙම කලාපය සතුව පැවතීමත්, එම නිධි බොහොමයක් තවමත් නොඉඳුල්ව පැවතීමත් ලෝක බලවතුන්ගේ අවධානය මෙම කලාපය වෙත ලැබීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

තෙල් අපනයනය කරන ප්‍රධාන රටවල් ගණනාවක් එක්ව ගොඩනගාගත් OPEC හා සමාන සංවිධානයක් ගොඩනගාගැනීම පිළිබඳවද වසර කිහිපයක පටන් සාකච්ඡා ආරම්භ වී ඇත. මේ සඳහා ලිතියම් ත්‍රිකෝණයේ රටවල්වලට අමතරව මෙක්සිකෝවද එක්ව ඇත. ලිතියම් නිෂ්පාදනය සහ මිල පාලනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වී තිබේ. එහෙත් මෙම රටවල් අතර පවතින දේශපාලන වෙනස්කම් නිසා මෙම ක්‍රියාවලිය ඉදිරියට යෑම සඳහා අවශ්‍ය අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම දිනෙන් දින ප්‍රමාද වෙමින් ඇත. ලෝක දේශපාලනය තුළ වාම ස්ථාවරයක සිටින බොලීවියාවේ සහ මෙක්සිකෝවේ වර්තමාන පාලනයන් මෙම සංවිධානය බිහිකිරීමට දැඩි ලෙස උත්සාහ ගන්නා ලද බව පෙනුණද ආජන්ටිනාවේ පාලනය වාමාංශික ස්ථාවරයක සිට අන්ත දක්ෂිණාංශික ස්ථාවරයකට මාරුවීමත් සමග එය ප්‍රමාද වන බව පෙනී යයි. මෙවන් සංවිධානයක් ගොඩනගාගැනීම මගින් තම රටේ පවතින විදෙස් සහ පුද්ගලික අංශයේ ආයෝජනවලට බලපෑමක් සිදුවනු ඇතැයි සැකකරන චිලියද මෙම එකඟතා සම්බන්ධයෙන් පරෙස්සමින් කටයුතු කරමින් සිටී.

වර්ධනය වෙමින් පවතින තත්වයන් හමුවේ ලිතියම් ත්‍රිකෝණය වෙත ලෝක බලවතුන්ගේ අවධානය වැඩි වී තිබේ. වර්තමානයේ මෙම කලාපයට අයත් ලිතියම් වෙළඳපොළ සඳහා වැඩිම බලපෑමක් එල්ල කර ඇත්තේ චීනයයි. බොලීවියාවේ සහ චීනයේ වාමාංශික පාලනයන් පැවතීමත්, ආජන්ටිනාවේ පෙර පැවති පාලනය වාමාංශික ස්ථාවරයක සිටීමත් චීනයට වාසිදායක වී ඇත. එමෙන්ම ලිතියම් පිරිපහදුවේදී චීනය දරන ආධිපත්‍යය විසින් කිසිවකුට ඔවුන් මගහැර යා නොහැකි තත්ත්වයක්ද ඇතිකර තිබේ. නිස්සාරණය කරන ලිතියම්, බැටරි නිෂ්පාදනය කළ හැකි ආකාරයට පරිවර්තනය කිරීම සඳහා චීනය වෙත අපනයනය කිරීමට ඕස්ට්‍රේලියාවට පවා සිදුව ඇත.

චිලීයේ විශාලතම ලිතියම් සමාගමේ ප්‍රධාන හවුල්කරුවා වී ඇත්තේ චීනයේ 'ටියැන්චි ලිතියම්' සමාගමයි. ආජන්ටිනාවේ 'කොවුචාරි ඔලාරොස්' ලිතියම් ව්‍යාපෘතියේ කොටස්වලින් 51%ක හිමිකාරිත්වය දරන්නේ චීනයේ 'ගැන්ෆෙන්ග් ලිතියම්' සමාග මයි. මීට අමතරව චීනයේ 'ෂිජින් මයිනින්' සමාගමද කලාපයේ ආයෝජන රැසක් සිදුකර ඇත. එමෙන්ම බොලීවියාවේ ඇති නිස්සාරණයට අසීරු ලිතියම් නිස්සාරණය කරගැනීම සඳහා දැවැන්ත මුදල් ආයෝජන සිදුකරමින් චීනය අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇත.

ලිතියම් ආධිපත්‍ය ලබාගැනීම මගින් බලශක්තිය කෙරෙහි චීනයේ ඇති මැදිහත්වීම පාලනය කිරීමට එක්සත් ජනපදයද ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. ඔවුන් 2022දි හඳුන්වාදුන් Inflation Reduction පනත මගින් විදුලි වාහන සඳහා ලබාදෙන ඩොලර් 7,500ක බදු සහනය ලබාගැනීමට නම් එම වාහන බැටරි සඳහා භාවිතා කරන ලිතියම් වැනි ඛනිජවලින් 40%ක් (2027දී මෙය 80% දක්වා වැඩිකිරීමට යෝජිතය) එක්සත් ජනපදය සමග නිදහස් වෙළඳ ගිවිසුම් සහිත රටවලින් ලබා ගත යුතු බවට නීතිගත කරන ලදී. මේ මගින් එවැනි ගිවිසුම් ගත වීමක් හිමි චිලී රාජ්‍යයට විශාල වාසියක් හිමි වූ අතර එක්සත් ජනපද සමාගම් චිලී රාජ්‍යයේ ලිතියම් සඳහා ආයෝජන වැඩිකිරීමටද හේතු විය. තමන්ට හිතවාදී රාජ්‍යයක් වූ ආජන්ටිනාව සමග එවැනි ගිවිසුමක් නොමැති වූවද එක්සත් ජනපදය විවිධ මූල්‍ය ආයතන මගින් එරට ලිතියම් ව්‍යාපෘති සඳහා ඩොලර් මිලියන සිය ගණනින් සෘජු ණය සහ ආයෝජන ලබාදීමට පටන්ගෙන ඇත. එමෙන්ම 2022දී එ.ජ. මූලිකත්වයෙන් Mineral Security Partnership සංවිධානය ගොඩනැගුණේද ලිතියම්, නිකල්, කෝබෝල්ට් වැනි දුර්ලභ ඛනිජ සැපයුම් දාම තුළ ආධිපත්‍ය තහවුරු කරගැනීම සඳහාය. කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජපානය, ද.කොරියාව, බ්‍රිතාන්‍ය, ඉන්දියාව ආදී රටවල් 14ක් මෙහි සාමාජිකයින්ය.

11 වැනි පිටුවට

## සැම්බියාව - අධිකරණ අගුළු දමයි




පසුගියදා සැම්බියාවේ පැවති ජනාධිපතිවරණයෙන් එරට හිටපු ජනාධිපති හකයින්දේ හිචිලෙමා නැවත ජයග්‍රහණය කරමින් සිය දෙවන ධුර කාලය ආරම්භ කළේය. සමස්ත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 61.4%ක් ලබාගැනීමට ඔහු සමත් විය.

මෙම මැතිවරණ ප්‍රතිඵලයට එරෙහිව එරට විපක්ෂය අධිකරණයට යාමට සූදානම් වූවද, ව්‍යවස්ථාවට අනුව නඩු පැවරිය හැකි අවසන් දිනයේ එරට ප්‍රධාන උසාවි සියල්ලම අගුළු දැමීමට සැම්බියා පොලීසිය කටයුතු කර ඇත.

## ඉන්දියාව - උස්බෙකිස්ථානය සමග වෙළඳ ගිවිසුමකට



පසුගිය අගෝස්තු මාසය අවසානයේ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි විසින් සිදු කළ උස්බෙකිස්ථාන සංචාරය අතරතුර දෙරට අතර වෙළඳ කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් 11කට අත්සන් තබා ඇත. ලොව 07 වෙනියට විශාලතම යුරේනියම් සැපයුම්කරුවා වන උස්බෙකිස්ථානය සමග යුරේනියම් ආනයනය සම්බන්ධයෙන් ඉන්දියාව අත්සන් කළ ගිවිසුම ඒ අතර ප්‍රධාන වේ.

මීට අමතරව ආරක්ෂක, සයිබර් ආරක්ෂක, වෙළඳ මාර්ග, ඩිජිටල් යටිතල පහසුකම් ආදී දේ සම්බන්ධ ගිවිසුම් කිහිපයක්ද මේ අතර වේ.

## නයිජීරියාව - ආණ්ඩුවට එරෙහි ජනතා නැගිටීම් ඇවිලේ




නයිජීරියාව තුළ පවතින ඉන්ධන සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම ඇතුළු 30% ඉක්මවූ උග්‍ර උද්ධමනය සහ රාජ්‍ය පාලනයේ පවතින දූෂණයට එරෙහිව එරට අගනගරය ඇතුළු නගර ගණනාවක ජනතා උද්ඝෝෂණ රැසක් පසුගිය අගෝස්තු මාසය තුළ වාර්තා විය. 'End Bad Governance' යන්න මෙම උද්ඝෝෂණ තුළ ප්‍රධාන සටන්පාඨය වී තිබේ.

මෙම උද්ඝෝෂණ මර්දනය කිරීමට ආණ්ඩුව විසින් කඳුළු ගෑස් මෙන්ම බැටන් ප්‍රහාරද සිදු කළ අතර නගර කිහිපයකම ඇඳිරි නීතිය පැනවීමද සිදුකර තිබිණි.

## ආර්ජන්ටිනාව - දුප්පත්කම වර්ධනය වෙමින්



ආර්ජන්ටිනාවේ බලයට පත්වූ අන්ත දක්ෂිණාන්ශික ජනාධිපති ජේවියර් මිලේගේ ආර්ථික ප්‍රතිසංස්කරණ හමුවේ එරට දරිද්‍රතා අනුපාතය 50% ඉක්මවා තිබේ. ඔහුගේ ආණ්ඩුව විසින් අයවැය පරතරය අඩුකිරීම උදෙසා රාජ්‍ය සහන සහ යටිතල පහසුකම් වෙනුවෙන් වෙන් වූ මුදල් සැලකිය යුතුමට්ටමින් කප්පාදු කිරීම මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන ලෙස බලපා ඇත.

ප්‍රවාහනය, විදුලිය, ගෑස් සහ ජල ගාස්තු සඳහා ලබාදුන් සහන ඉවත්වීමත් සමග ජීවන වියදම ඉහළ යෑමත්, පේසෝ මුදල් ඒකකය 50%කින් පමණ බාල්දු කිරීම නිසා භාණ්ඩ මිල ඉහළ යාමත් මෙම තත්ත්වය වර්ධනය වීමට තවදුරටත් හේතු වී ඇත.

# ආර්ථික ස්ථාවරභාවය සහ බලය



"ධනපති ක්‍රමය හා කොමියුනිස්ට් ක්‍රමය අතර ඒ දෙකෙහිම අංග ලක්ෂණ හා ගතිගුණ ඒකාබද්ධ කර ගත් නිශ්චිත පර්වර්තනීය කාල පර්ච්ඡේදයක් පවතින බවට න්‍යායික වශයෙන් සැකයක් තිබිය නොහැකිය. මෙම පරිවර්තනීය කාල පරිච්ඡේදය අභාවයට යන ධනපති ක්‍රමයත් වැඩීගෙන එන ළදරු කොමියුනිස්ට් ක්‍රමයත් අතර කෙරෙන අරගලයක කාලයක් විය යුතුය. නැතහොත් වෙනත් වචනවලින් කිවහොත් පරාජය කර ඇති, එහෙත් විනාශ කර නැති ධනපති ක්‍රමයත් උපත ලබා ඇති, එහෙත් තවමත් දුර්වලව තිබෙන කොමියුනිස්ට් ක්‍රමයත් අතර අරගලයක කාලයක් විය යුතුය.

**ලෙනින්**
**තෝ. කෘති, 10 වෙළුම, 46 පිටුව**

ශ්‍රී ලංකාව දශක කිහිපයක සිටම පැවතියේ ආර්ථික අර්බුදයකය. එහි කූටප්‍රාප්තිය පැමිණෙන්නේ 2022 වසරේය. එතෙක් ගමන් කළ වැරදි ආර්ථික ප්‍රතිපත්තීන් සහ අදක්ෂ වංචාකාරී කපටි පාලකයින් අත තිබූ ශ්‍රී ලංකාවේ තීරණ ගැනීමේ බලය 2024 අග භාගයේ ජනතා බලයක් වෙතට මාරු විය. එතැන් පටන් බංකොලොත්භාවයේ නමින් ලියවී තිබූ ආර්ථිකය නැවත පණ ලබමින් වර්ධනය වන්නට විය. ඒ අනුව පසුගිය වසර දෙකක කාලය තුළ ලංකාවේ ආර්ථිකය සුබවාදී මාවතකට පිවිස තිබේ. එය ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් ආර්ථික සංවිධානවල පැසසුමටද ලක්වී ඇත. විශාල අර්බුදයකට ලක්වූ ලෝකයේ දුප්පත් රටවල් කිසිවක් ඉතා කෙටි කාලයකින් අප මෙන් යහපත් මට්ටමට ළඟා වී ආර්ථිකය ස්ථාවර කරගෙන නැත. එය පසුගියදා මහ බැංකු අධිපතිවරයා විසින්ද ප්‍රකාශයට පත්කරනු ලැබ තිබුණි. මෙලෙස පසුගිය කෙටි කාලයේ ආර්ථික දත්ත කිහිපයක්, ඊට කලින් වසරවල් සමග සැසඳීමෙන් ඒ පිළිබඳ අදහසක් අපට ලබාගත හැක.

රටක ආර්ථිකය මනිනු ලබන ප්‍රධාන නිර්ණායකයක් බවට පත්වන්නේ එරටෙහි දළ දේශීය නිෂ්පාදනයයි. ඒ මගින් ආර්ථිකයේ විවිධ අංශයන්හි ඇතිවී ඇති වර්ධනය හෝ පසුබෑම දැකගත හැක. රටක ආර්ථික වර්ධනය මනිනු ලබන ප්‍රධාන නිර්ණායකයක් වන්නේත් දළ දේශීය නිෂ්පාදනයයි. පහතින් සඳහන් වන්නේ වසර කිහිපයක දළ දේශීය නිෂ්පාදනයයි.

**දළ දේශීය නිෂ්පාදනය ඩො.මි.**

| 2022 | 2023 | 2024 | 2025 | 2026 (මාස 06) |
|---|---|---|---|---|
| 76,845 | 84,131 | 99,637 | 108,837 | 114,300 |

ලංකාවේ ආර්ථිකය දශක කිහිපයක් පුරාම පැවතියේ ඩොලර් බිලියන 100කට (මිලියන 100,000) වඩා පහළ මට්ටමකය. එය ඩොලර් බිලියන 100ක අගය පසු කලේ 2025 වසරේය. ඒ, 5% ක ආර්ථික වර්ධනයක්ද අත්පත්කර ගනිමිනි. ඍණ ආර්ථික වර්ධනයක් පැවති 2022 වසරේ සිට ඉතා කෙටි කාලයක් තුළ ආර්ථිකය ස්ථාවර මට්ටමට පත්වීම ඉතා යහපත් තත්වයකි. එනිසාම 2025 වසරේ ලංකාවේ ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000 සීමාව ඉක්මවා යාමට සමත් වූ අතර එනිසාම ශ්‍රී ලංකාව මධ්‍යම ආදායම් මට්ටමේ රටක් බවට උසස් විය. දශක ගණනාවක් ඩොලර් 4,000 සීමාවේ පැවතීමත් එය 5,000 සීමාව ඉක්මවීමට නොහැකි වීමත් ඒක පුද්ගල ආදායමේ උගුල ලෙස සඳහන් කරන අතර එම සීමාව ඉක්මවූ රටවල් ඉතා ඉක්මනින් ආර්ථිකය යහපත් අතට පත්කරගන්නා බවට අත්දැකීම් ඇත. පහතින් පළවන්නේ ඒක පුද්ගල ආදායමේ පසුගිය වසර කිහිපයෙහි දත්තයන්ය.

**ඒක පුද්ගල ආදායම ඩො.මි.**

| 2022 | 2023 | 2024 | 2025 | 2026 (මාස 06) |
|---|---|---|---|---|
| 3,464 | 3,830 | 4,546 | 5,010 | 5,200 (Est) |

මෙම දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට සාපේක්ෂව ආර්ථිකයේ අනෙකුත් අංශවල හැසිරීමද වැදගත්ය. එක් අංශයක වර්ධනය අනෙකුත් අංශවලින් විද්‍යමාන විය යුතුය. ඒ අනුව ලංකාවේ අපනයන වර්ධනය වී ඇති අතර 2025 වසරේ කලින් වසරට වඩා 6.3% අපනයන ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරයි. ස්වභාවික විපත් හමුවේ වුවද නිෂ්පාදනය කඩා නොවැටී පවත්වාගෙන යාහැකි වීමත් මෙයට එක් හේතුවක් ලෙස ගත හැක. රටකට විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ගයක් ලෙස අපනයන ආදායම ඉහළ යාම ආර්ථිකයේ අනෙකුත් විනිමය අවශ්‍යතාවයන් විසඳා ගැනීමට පහසුවක් සපයයි. විශේෂයෙන් ණය ගෙවීමට සහ ආනයන සඳහා ප්‍රමාණවත් අපනයන ආදායමක් නොතිබීම අප රටෙහි පැවති ප්‍රධාන ගැටලුවක් වූ අතර එයට පිළිතුරක් මෙලෙස වර්ධනයන් අත්පත් කරගැනීම මගින් ලබාගත හැක.



මේ ආර්ථික වර්ධනයේ සහ අපනයන වර්ධනයට

**අපනයන ආදායම ඩො. මි.**

| 2022 | 2023 | 2024 | 2025 | 2026 (මාස 06) |
|---|---|---|---|---|
| 13,106 | 11,910 | 12,772 | 13,581 | 7,500 |

සාපේක්ෂව ලංකාවේ සේවා වියුක්ති අනුපාතයද ක්‍රමයෙන් පහළ යමින් පවතී. ඉතිහාසයේ පළමු වතාවට ලංකාවේ විරැකියා අනුපාතය 3.5% දක්වා පහළ වැටී ඇත. එය පහත සටහනින් පිළිබිඹු වේ.

**සේවා වියුක්ති අනුපාතය**

| 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| 5.1% | 4.7% | 4.7% | 4.4% | 3.5% |

රජයක් ලෙස රටෙහි නිෂ්පාදනය ඉහළ නංවා රැකියා අවස්ථා පුළුල් කළ හැකිනම් බොහෝ ආර්ථික ගැටලුවලට විසඳුම් සෙවිය හැක.

විදේශ විනිමය මෙන්ම රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමත් රජයක ප්‍රධාන වගකීමකි. ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති සියලු රජයන් ජනතාවගෙන් එකතු කරගත් බදු මුදල් නාස්ති කළ අතර එය නැවත වටයකින් එකතු කරගත්තේ අලුත් වක්‍ර බදු පැනවීමෙනි. ලංකාවේ පළමු වතාවට අපගේ රජය විසින් වක්‍ර බදු අනුපාතයන් වෙනස් නොකර බදු ආදායම ඉහළ නංවා ගත්තේය. ඒ, බදු එකතු කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමෙන් සහ ක්‍රමවත් කිරීමෙනි. එහි ප්‍රතිපලයක් ලෙස ලංකාවේ බදු ආදායම විශාල ලෙස ඉහළ ගියේය. අලුතින් බදු නොපනවා බදු ආදායම වැඩිකර ගැනීම ඉතා දියුණු බදු කළමනාකරණයකි. ඒ අනුව 2024 වසරට සාපේක්ෂව 2025 වසරේ බදු ආදායම 35%කින් පමණ වැඩිකරගෙන ඇත. එය පහත සටහනින් පැහැදිලි වේ.

**රාජ්‍ය බදු ආදායම රු. බි.**

| 2022 | 2023 | 2024 | 2025 | 2026 (මාස 06) |
|---|---|---|---|---|
| 1,751 | 2,720 | 3,705 | 5,060 | 2,800 |

මෙලෙස ආදායම ඉහළ දමා ගැනීමට හැකිවීමෙන් භාණ්ඩාගාරයේ මුදල් අතිරික්තයක් නිර්මාණය කරගත හැකිවූ අතර එනිසාම විදේශ ණය ලබා නොගෙන ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට මුදල් යෙදවීමට හැකිවූ අතර දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත්වූ අයට සහන සැලසීමටද මෙය ඉවහල් විය. ලංකාවේ පළමු වතාවට විදේශ ආධාර හෝ ණයවලින් තොරව මාර්ග ව්‍යාපෘතියක් ඇරඹීම මෙයට කදිම නිදසුනකි. අනෙක් අතට මෙලෙස බදු ආදායම ඉහළ යෑමට බලපෑ හේතුන් අතර පොදුවේ නීතිය ක්‍රියාත්මක වීමත් බදු එකතු කිරීමේදී සිදු වූ වංචාවන් අඩු වී යාමත් හේතු විය. ඒ අතරම බදු ගෙවන්නන් තමන් ගෙවන බදු සම්බන්ධයෙන් තෘප්තිමත් වීමත් බදු පැහැරහැරීමට දක්වන උනන්දුව අඩුවීමත් නිසා පසුගිය වසර දෙකකට ආසන්න කාලයේ බදු ආදායම විශාල ප්‍රමාණයකින් ඉහළ ගියේය.

බදු ආදායමේ ඉහළ යාම රාජ්‍ය අයවැය ලේඛනයටද විශාල පහසුකමක් ඇති කළේය. ඒ හේතුවෙන් අයවැය හිඟය බිලියන 700 මට්ටමට පහළට ආ අතර එයද ලංකාවේ ආර්ථිකයේ කෙටිකාලීන ප්‍රගතිය විදහා දක්වන හොඳම සාධකයක් විය. පසුග ිය කාලය පුරාම රාජ්‍ය අයවැයෙහි විශාල හිගයන් පැවති අතර එම හිඟයන් පියවා ගැනීමට සිදුවූයේ ණය ගැනීමෙනි. එලෙස විශාල අයවැය පරතරයක් දිගින් දිගටම පැවතීම ලංකාවේ ණයබර විශාල ලෙස දිගින් දිගටම ඉහළ යාමට හේතුවූ අතර එය ආර්ථික අර්බුදයේම දිගුවක් ලෙස පැවතුණි. එහෙත් 2025 වසරේ සිට මෙය ඉතා වාසි සහගත ලෙස පැවතීම නිසා ණය මත වන පීඩනය පහළ ගියේය. පහතින් දැක්වෙන්නේ වසර කිහිපයක අයවැය හිඟය පැවති ආකාරයයි.

**අයවැය හිඟය රු.බි.**

| 2022 | 2023 | 2024 | 2025 | 2026 (මාස 06) |
|---|---|---|---|---|
| 2,460 | 2,282 | 2,039 | 744 | 700 |

පසුගිය වසර දෙකෙහි ආර්ථිකය මනාලෙස හැසිරවීම නිසා රාජ්‍ය ණය ගෙවීමේ ගැටලුවද ආණ්ඩුවට කළමනාකරණය කරගැනීමට හැකි විය. ඒ අනුව මෙතෙක් නොගෙවා තිබූ ණය වාරික ගෙවීමට හැකියාව ලැබුණු අතර ණය සම්බන්ධයෙන් තිබූ අවදානමද අවම කර ගත්තේය. යහපත් මූල්‍ය කළමනාකරණයක් රට තුළ පවත්වාගෙන ගිය නිසා වැඩිපුර ණය ගැනීමේ අවශ්‍යතාවයක්ද පැන නොනැගුණි. එනිසාම දිගින් දිගටම් ණය ගනිමින් ණය උගුලක සිරවී සිටි රාජ්‍යයක් එයින් ගැලවීමට අවශ්‍ය පළමු පියවර අපගේ ආණ්ඩුවෙන් ගැනීම නිසා විදේශ ණය මට්ටම පැවති තත්වයෙන් පවත්වා ගැනීමට හැකියාව ලැබුණි. එය පසුගිය වසර කිහිපයෙහි රාජ්‍ය ණය පිළිබඳ දත්ත දෙස බැලීමෙන් පැහැදිලි වේ.

යහපත් මූල්‍ය කළමනාකරණය නිසා පහසුවෙන් ණය ගෙවීමට හැකියාව ලැබුණ අතර එනිසාම යහපත් විදේශ සංචිත ප්‍රමාණයක්ද තබා ගැනීමට හැකි විය. අනාගතයේ ණය ගෙවීමට නොහැකි යයි බිල්ලෙක් මවා සිටි විපක්ෂය දැන් එතැනින් පල්ලම් බැස ආර්ථික අර්බුදය 2029 දක්වා කල්දමා ඇත. එහෙත් ණය වාරික ගෙවීමට ඇති හැකියාව පහත ඇති විදෙස් සංචිත දත්ත මගින් නැවත තහවුරු වේ.

| | 2026 මාර්තු | 2025 | 2024 | 2023 |
|---|---|---|---|---|
| දේශීය ණය ඩො.මි. | 61,497 | 62,693 | 64,571 | 58,848 |
| විදේශීය ණය ඩො.මි. | 37,468 | 37,663 | 36,880 | 37,334 |
| රාජ්‍ය ව්‍යාපාර | 3,279 | 3,484 | 4,896 | 4,500 |
| සමස්ත ණය | 102,244 | 103,840 | 106,347 | 100,682 |

**නිල විදේශ සංචිත**

| 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| 1,897 | 4,392 | 6,122 | 6,838 |

ඉහත සියලු කරුණු සහ දත්ත සැලකිල්ලට ගත්කළ එහි ඇති සුවිශේෂීතාවය වන්නේ එම දත්ත එකකින් අනික තහවුරු කරනා බවයි. රටක බලය පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය කරුණක් වන්නේ එරටෙහි ආර්ථික ස්ථාවරභාවයයි. පසුගිය වසර දෙකකට ආසන්න කාලය තුළ අප රජය විසින් ආර්ථික ස්ථාවරභාවය තහවුරු කර ඇත. එනිසා අනාගතයේදී ණය ගෙවීමේ හෝ ප්‍රාග ්ධන ආයෝජන සඳහා හෝ වෙනත් කිසිදු මූල්‍ය අර්බුදයකට රට මුහුණ නොදෙන බවට හොඳටම විශ්වාසය.

> රටක බලය පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය කරුණක් වන්නේ එරටෙහි ආර්ථික ස්ථාවරභාවයයි. පසුගිය වසර දෙකකට ආසන්න කාලය තුළ අප රජය විසින් ආර්ථික ස්ථාවරභාවය තහවුරු කර ඇත. එනිසා අනාගතයේදී ණය ගෙවීමේ හෝ ප්‍රාග්ධන ආයෝජන සඳහා හෝ වෙනත් කිසිදු මූල්‍ය අර්බුදයකට රට මුහුණ නොදෙන බවට හොඳටම විශ්වාසය.

# "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" වෙනුවෙන්!



"අපි දැන් කළු කුහරයට ඇතුල් වෙලා ඉවරයි. ආපසු හැරීමක් නෑ. මීට පෙර හිටපු බොහෝ අය මේ කළු කුහරය දිහා බල බලා, ඒක ඇතුළට යන්න තියෙන බිය නිසාම ඇතුල් නොවී හැරිලා ගියා. නමුත් අපි මේ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ නමැති කළු කුහරය ඇතුළට බැහැලා ඉවරයි. දැන් අපිට ආපසු හැරෙන්න බැහැ. මේ සටන අපි ජයග්‍රහණයෙන්ම කෙළවර කරන්න ඕනේ."

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා එම ප්‍රකාශය සිදු කළේ මත්ද්‍රව්‍ය නිවාරණය සහ මර්දනය පිළිබඳ පැවති වැඩසටහනකදී වුවත් සැබවින්ම ඔහුට බාර ගැනීමට සිදුවූයේ කළු රාජ්‍යයකි.

එම කළු රාජ්‍යට තිත තැබීම ආරම්භ කළ ඓතිහාසික ජයග්‍රහණයේ දෙවනි සැමරුම මේ මසට යෙදී තිබේ. එකී ජයග්‍රහණය පසුපස මෙරට දැවැන්ත කාන්තා නියෝජනයක් වූ බව ද ගැහැනු එකමිටකට එක් ව ලාංකීය දේශපාලනය උඩු යටිකුරු කරන්නට දායකත්වය ලබා දුන් බව ද ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙනු ඇත. සියවස් ගණනක් අප දුටු සිහිනය සැබෑ කිරීමේ අරමුණ පෙරදැරිව යුග දෙකකදී තම ජීවිත පරිත්‍යාගකළ සොයුරියන් නොවන්නට අප බොහෝ පසුපසින් හිඳිනු ඇත.

ඉන් මෙහා ඉතිහාසය පුරා කාන්තාවන් සමාජ ව්‍යාපාරය තුළට එක් කරගන්නට කකුල් ගෙවෙන තුරු ගෙයින්ගෙට කැන්වසින් ගිය, පත්තර, පත්‍රිකා බෙදාහරිමින් ජනතාව දැනුවත් කළ, එම කටයුතු සඳහා කැට හොල්ලමින් මුදල් සෙවූ, ගිනි අව්වේ පිච්චෙමින් වේල් ගණන් කුසගින්නේ හිඳිමින් මේ ජයග්‍රහණය වෙනුවෙන් තම අධ්‍යාපනය, රැකියාව හා ජීවිතය ම ද කැප කළ ආදරණීය සහෝදරියන්ගේ ධෛර්යය මේ පසුපස ඇති යෝධ ශක්තිය බව නොරහසකි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කරා යන ගමනේදී පළාත් පාලන ආයතන, පාර්ලිමේන්තුව මෙන්ම පරිපාලන ක්‍රියාවලියට ඉතිහාසයට සාපේක්ෂව වැඩි කාන්තා නියෝජනයක් පත්වීම කාන්තාවන් ලෙස අපට ආඩම්බර විය හැකි කාරණයකි.

එයින් නොනැවතී බලය ලබා ගැනීමට පෙර කාන්තාවන්ට දුන් පොරොන්දු එකින් එක ඉටු කරමින් ආණ්ඩුවක් ලෙස විශ්වාසය තහවුරු කරමින් සිටී. ඒ අනුව මෙරට මව්වරුන්ගේ හිසමත පැටවූ අධ්‍යාපනයේ පීඩනය ක්‍රමානුකූල ව අවම කිරීම සඳහා , පාසල් නිල ඇඳුම්, ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමට ආධාර, පාවහන් වව්චර්, විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ශිෂ්‍යත්ව, නොමිලේ සනීපාරක්ෂක තුවා ලබා දීම, පෝෂණ වැඩසටහන, උසස් පෙළ සමත් සිසුන්ට ලොව හොඳම සරසවි වෙත පිවිසීමට ශිෂ්‍යත්ව ලබා දීම ආදිය සිදුකෙරෙමින් පවතී.

එසේම අධ්‍යාපනය සඳහා අයවැයෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩිකරමින් තවත් බොහෝ සහන ලබා දීමට නියමිත වේ.

මීට අමතර ව ජනතාවගේ නිරෝගී ජීවිතයක් උදෙසා සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම තුළින් මෙරට බහුතරයක් වූ කාන්තාවන්ට සහන ප්‍රමාණයක් හිමිවේ. විශේෂයෙන් ගර්භිණී මව්වරුන්ගේ පෝෂණය හා සෞඛ්‍ය පිළිබඳ වැඩි අවධානයක් යොමුව තිබේ. එසේම ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද කටයුතු සිදුකරමින් පවතී.

මීට අමතර ව අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආධාර ලබා දීම ආදිය මෙන්ම කාන්තා ක්‍රියාකාරී සමිතිවල අඩු ආදායම් ලාභී කාන්තාවන් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම ට ද අයවැයෙන් මුදල් වෙන්කර තිබේ.

එසේම සමාජ ආරක්ෂාවට මෙන්ම පවුලේ ආරක්ෂාවට තර්ජනයක් වී ඇති මත්ද්‍රව්‍ය තුරන් කිරීම වෙනුවෙන් දැවැන්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් තිබීම මෙරට බොහෝ කාන්තාවන්ගේ අස්වැසිල්ලට හේතුවක් වී තිබේ. පාතාලය මර්දනය කරමින් සමාජ ආරක්ෂාව තහවුරු කරමින් යන මේ ගමනේ අස්වැසිල්ල ගැහැනු අපටමය.

එසේම ප්‍රජා ශක්ති වැඩසටහන තුළින්ද ග්‍රාමීය කාන්තාවන් සවිබල ගැන්වීමට අපේක්ෂා කෙරේ. ස්වභාවික ව්‍යසනයකදී ද ඉතා කඩිනමින් ජන ජීවිත යථා තත්වයට පත්කරමින් ජනතාවට ඉතිහාසයේ නොවූ විරූ සහන ලබා දෙමින් කටයුතු කිරීම අගය කළ යුතුම ය.

මෙවැනි සියලු වැඩසටහන් තුළින් රටේ සාතිශය බහුතරයක් වූ කාන්තාවන්ගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම සිදුවෙමින් පැවතීම අප පැතූ වෙනසයි.

වසර දෙකක් වැනි කෙටි කාලයක් ඇතුළත පීඩාවට පත් වූ මෙරට ජනයා ඉන් මුදවා ගැනීමේ දිශානතියක රට ගමන් කරමින් සිටින බව ජාතික ව මෙන්ම ජාත්‍යන්තරවත් අද පිළිගැනීමට ලක්ව තිබේ. නමුත් මෙය පහසු ගමනක් නොවන බව ඉතා පැහැදිලිය. වියරු වැටී ඇති සතුරු පාර්ශ්වයන් එක් මිටකට එක්ව අතට හසුවන ඕනෑම දෙයකින් දමා ගැසීමට පසුබට නොවන බවට ඕනෑ තරම් සාක්ෂි අප සතුව ඇත.

මෙවන් වටපිටාවක් තුළ හුදකලාව නොව කාන්තාවන් ලෙස සංවිධානාත්මකව මෙම සතුරු බලවේගයන්ට එරෙහිව මෙන්ම රටේ සංවර්ධන ක්‍රියාවලියටය දායක වුවහොත් වසර දෙකක් තුළ ලැබූ ජයග්‍රහණයන්ට වඩා පිම් ගණනාවකින් ඉහළ ජයග්‍රහයන් ඉතා කෙටි කාලයක් තුළ ලබාගත හැකිවීම අනිවාර්යය.

## අත්නොහැර රකින ඒ සොඳුරු සිහිනය!

උණුහුමින් විඩාබර
ඉරි තැලුනු මහී මව් පපුතුර
නිවන්නට හෙමි හෙමින්
අවසර අරන්
බලන්
ඉඩෝරය නිම කර
අරුමැසි ම සැප්තැම්බරය ඇවිදින්
මල් පිපෙන වසන්තය අරන්...

දුක් කඳුළු ගැබ්බර
සෘතූන් බොහොමයක් අතර
ගාටමින් වුණත්
දුර ඇවිදින්
බලන්....
නිවුණා ය ගැහැනුන්
අභිනික්මනේදිත්
නිබ්බුත පද ම ගයමින්...

සියවස් ගණන් දුටු
සැබෑ වූ සිහිනයකි මේ
වසන්තය අප සතු
බලන්...
ගැහැනු හරි හරියට
එකී සිහිනය පාට කළ යුරු

දනිමු...
අත් නොහැර
දිවි හිමියෙන්
රකින බව ඒ සොඳුරු සිහිනය
මහා පවුරක් ව ගැහැනුන්..

## ජන මතය!

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ජපන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (JICA) එක්ව සංවිධානය කළ "JICA WEE Project" ග්‍රාමීය ව්‍යවසායිකාවන් බලගැන්වීමේ සහ ජාලකරණ (Networking) විශේෂ වැඩසටහන අගෝස්තු 04 වන දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී සාර්ථකව පැවැත්විණි. මොනරාගල සහ අම්පාර දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පැමිණි ග්‍රාමීය ව්‍යවසායිකාවන් රැසක් ඊට සහභාගී වූහ.

නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය නාමල් සුදර්ශන සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාව සඳහා අමාත්‍යාංශ ලේකම් තරංගනී වික්‍රමසිංහ මහත්මිය, අතිරේක ලේකම්වරුන්, කාන්තා කාර්යාංශයේ සහ JICA ශ්‍රී ලංකා ආයතනයේ නිලධාරීන් එක්ව සිටියහ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ නියෝජිත පිරිසක්, 2026 ජූලි 25 සිට අගෝස්තු 02 දක්වා චීනයේ සිදු කළ නිල සංචාරය සාර්ථකව අවසන් කළහ. චීනයේ ගුවැන්ඩොං පළාතේ ෂෙන්සෙන් (Shenzhen) සහ ගුවැන්ෂෝ (Guagzhou) නගර කේන්ද්‍ර කරගනිමින් පැවති මෙම වැඩසටහන තුළ නිල හමුවීම්, අධ්‍යයන සැසි, ආයතනික සංචාර සහ සංස්කෘතික වැඩසටහන් රැසකට නියෝජිත පිරිස සහභාගි වූහ. ඒ හරහා චීනයේ සංවර්ධන අත්දැකීම්, නවෝත්පාදන පරිසර පද්ධති සහ පාලන ක්‍රමවේද පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව උදා විය.

මෙම නියෝජිත පිරිසට කාන්තා හා ළමා කටයුතු ගරු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය විසින් නායකත්වය ලබා දෙන ලදී.



## ජනතා ජයග්‍රහණ වෙනුවෙන් පෙරට එන්න!



**සමන්මලී ගුණසිංහ සහෝදරිය**
**පාර්ලිමේන්තු මන්ත්‍රී**

ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට වසර දෙකක් පිරෙන මේ මොහොත වෙනකොට විශේෂයෙන්ම ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ඇතුළුව අනෙකුත් අමාත්‍යාංශවල ක්‍රියාකාරීත්වය සතුටු දායක තත්වයක තිබෙනවා. මේ වනවිට පෙර පාසල්, පාසල් ආදියෙහි අධ්‍යාපන ප්‍රතිපත්ති නව ප්‍රතිපත්ති මාලාවකට ගෙන එන්න අපිට පුළුවන් වුණා.

දෙමව්පියන් අහිමිව නිවාසවල සිටින දරුවන් වගේම ආබාධිත දරුවන් වෙනුවෙන් "අරථ" වැනි වැඩසටහන් ක්‍රියාත්මකයි. නිවසක් කියන්නෙ දරුවන්ට කාන්තාවන්ට ආරක්ෂාව තහවුරු කරන විශාල තෝතැන්නක්, රජයේ නිවාස වැඩපිළිවෙළ යටතේ විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී, ආබාධිත, තනි පවුල් සහ ආරක්ෂිත නිවාස නැති අය වෙනුවෙන් ප්‍රමුඛතාවයක් ලබා දී තියෙනවා. ඒ වගේම කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ස්වයං රැකියා, ප්‍රජා ශක්ති වැනි වැඩ සටහන් ආරම්භ කළා.

ආණ්ඩුව පත් කිරීමට එක මිටකට එකතුවෙලා කටයුතු කළා සේම අද දවසේත් ජනතා ජයග්‍රහණ වෙනුවෙන් පෙරට එන්න කියල අපි කාන්තාවන්ට ආරාධනා කරනවා.

# නන්දා මාලනී
# සිංහල සංගීතයේ නොමැකෙන සලකුණ

නන්දා මාලනී ගැන සංවාදයේ දී වැඩිපුරම කතාබහට ලක් වූයේ ඇයගේ විරෝධාකල්ප ගීත පිළිබඳවයි. එහෙත්, ඇය සුවිශේෂී වීමට වෙනත් කරුණු රැසක් පදනම් වේ. මේ ලිපියෙන් අවධානය යොමු කරන්නේ ඇය සුවිශේෂී වීම කෙරෙහි බලපෑ, විරෝධාකල්ප ගීත ගායිකාවගේ භූමිකාව මෙන්ම ඉන් ඔබ්බට ගිය කරුණු සම්බන්ධයෙනි.

## සරල ගීය

සිංහල ගුවන් විදුලියට ළමා ගී ගායිකාවක ලෙස පිවිසි ඇය වඩාත් ශක්තිමත්ව සිය නිර්මාණ තුළ තහවුරු කරගනු ලැබුවේ ගුවන්විදුලි සරල ගී ගායිකාවක ලෙසිනි. ප්‍රේමසිරි කේමදාස සරල ගීතය ගැන කළ නිර්වචනයකට අනුව එය ගැඹුරු සංගීත රසවින්දයකට මෙහා පවතින පොදු ජනයාට සමීප රසවින්දන මාධ්‍යයක් විය. නන්දා මාලනී මේ ක්ෂේත්‍රය තුළ අද්විතීය වෙනසක් සිදු කළාය.

ඇය සරල ගීය විවිධ තේමා කරා රැගෙන යාමට දායක විය. ගුවන් විදුලියට ගැයූ ගීත ඇසුරින් පළ කළ 'සාරි පොඩිත්තක්' හා 'තාරකා ඇස්' යන කැසට්පට දෙක විමසීමෙන් ඇගේ මෙම කුසලතාව වටහා ගත හැකිය. එම කැසටයේ අඩංගු ගීත අතර බුදු ගුණ ගීත, ආදරය, විරහව, පති-පතිනි ආදරය මෙන්ම මරණය සම්බන්ධ දාර්ශනික තේමා දක්වා පරාසයක සරල ගී ඇය ගායනා කරයි. සාරි පොඩිත්තක් යන නමින් පළ වූ ඇගේ ගීත එකතුව විමසා බැලීමේදී ද මෙම ලක්ෂණයම පෙනී යයි. මහගාම සේකර, ඩෝල්ටන් අල්විස්, ලූෂන් බුලත්සිංහල, සුනිල් ආරියරත්න ඇතුළු විවිධ පද රචකයින් රැසකගේ නිර්මාණය හින්දුස්ථාන රාගධාරී සංගීතය හා දේශීය ජන සංගීතය ඇසුරින් නිපැයූ තනු හා ස්වර රටාවන් සමග මුසුකරමින් ඇය මෙම නිර්මාණ ඉදිරිපත් කර ඇත. මෙනයින් අප නන්දා මාලනී සිය සරල ගී ගායනය නම් මූලික ප්‍රවේශයේදීම එම ආකෘතිය තුළ එතෙක් පැවැති සීමා පුළුල් කළ ගායිකාවක ලෙස හඳුනා ගත යුතුය.

## තනු/සංගීත රචිකාවිය

නන්දා මාලනී සිංහල සංගීත ක්ෂේත්‍රයට පිවිසීම ම කිසියම් විප්ලවීය ගුණයක් ප්‍රකට කළ සිදුවීමකි. සිංහල ගීතය කලක් ඉන්දියානු තනු නිර්මාණවලට සිංහල වචන යොදා ගායානා කළ අතර අනතුරුව විභේදනය වූ විද්වත් සම්ප්‍රදායේ ගීත නිර්මාණ බොහෝ දුරට ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතය ඇසුරින් නිර්මාණකරණයේ යෙදුණි. එකල (1960-70 දශක) සංගීත අධ්‍යක්ෂකවරුන් වන ආනන්ද සමරකෝන්, ඩබ්ලිව්.ඩී. අමරදේව වැනි ප්‍රවීණයින් එක් මඟක යද්දී සුනිල් ශාන්ත වැනි නිර්මාණකරුවෝ මෙරටට ආවේණික හෝ අනන්‍ය සංගීතයක් පිළිබඳ පර්යේෂණ කළහ. ඊට වෙනස්ම මඟක යමින් ප්‍රේමසිරි කේමදාස විසින් විශ්ව සංගීතයක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. විවිධ ශානරයන්ගේ පර්යේෂණ කටයුතු තිබියේ වී නමුදු මෙම කණ්ඩායමේ පොදු ලක්ෂණය වන්නේ ඔවුන් සියල්ලෝම 'පිරිමි' නිර්මාණකරුවන් වීමයි. නන්දා මාලනී ගීත සඳහා තනු රචනා කරමින්, සංගීතවත් කිරීමට පිවිසෙන්නේ මෙවැනි වටපිටාවකය. ඇය ප්‍රථම සිංහල ගීත සඳහා තනු හා සංගීත රචිකාව ලෙස සැලකෙන තරමටම, සිංහල ගීතය තුළ එකී භූමිකාවට පණ දුන් නිර්මාණකාරිනියක නැත.



තනු රචිකාවියක් ලෙස ඇගේ විශේෂත්වය වන්නේ ඒවායේ විවිධත්වයයි. ඉන්දියාවෙන් ශාස්ත්‍රීය සංගීතය හදාරා, හින්දුස්ථාන සංගීතය සිය අධ්‍යාපනික පදනම ලෙස සැලකුවද ඇය නිර්මාණකරණයේදී මෙරට ජන සංගීතය තුළ පැවැති විවිධ නාදමාලාවන් උපයෝගී කරගත් බව පෙනේ. ඉනිදු, ඇය ගීතයේ සංකල්පයට මැනවින් උචිත වන පරිදි එකී නාදමාලාවන් තෝරා බේරා ගැනීම වඩාත් කැපී පෙනේ.

අනුරාධ සෙනෙවිරත්න ලියූ " බුදු කරුණා දැස තෙමී" ගීතයේදී ඇය උපයෝගී කරගෙන ඇත්තේ පිරිත් ගායනයේ දී භාවිත නාද අනුකරණයකි. එකී ගායන ශෛලිය සහ ගාම්භීර තනු රටාව භක්ති රසය උත්කර්ෂයට නංවයි. එහි ස්වර වින්‍යාසය ඉන්දියානු සම්භාව්‍ය රාගයක ගාම්භීරත්වය සිහිපත් කරවන අතර, සරල සිංහල වචන තුළ ගැඹුරු අර්ථ ධ්වනිත කරයි.

ඩබ්ලිව්.ඒ. අබේසිංහ ලියූ "මිහිමඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා" ගීතයේදී, ඇය ළදරු මනසේ අසරණ හැඟීමට සුදුසු මධුර බව සහ ශෝකාන්විත ගැඹුර මිශ්‍ර කරමින් තනුවක් නිර්මාණය කළාය. මහින්ද අල්ගම ලියූ "රුක් අත්තන මල මුදුනේ" පිය ගුණ ගීයේදී ඇය ඊට හාත්පසින්ම වෙනස් මඟක් අනුගමනය කරමින් උකුසා වන්නමේ නාදමාලාව උපයෝගී කර ගත්තාය. උකුස්සා යනු තනිව සරන ගාම්භීර පක්ෂියකි. සිය පවුල රක්ෂණයෙහි යෙදුණු ඇගේ පියාගේ කැපවීම හා හුදකලා උත්සාහය ඇය උකුසා වන්නමේ නාදමාලාව තුළින් දැක්කා විය හැකිය.

මඩවල එස්. රත්නායක ලියූ "සැඳෑ කළුවර කුර ගගා විත්" ගීතයේදී ඇය විරහවට සාධාරණයක් ඉටු කළාය. එම ගීතය සඳහාද ඇය ජන කවි නාදමාලාව යොදා ගත් බව පෙනේ.

තමා වෙනුවෙන් මෙන්ම වෙනත් ගායිකාවක වෙනුවෙන් ඇය ගීතයක් නිර්මාණය කළ අවස්ථාවක් ලෙස දයා ද අල්විස් ලියූ "අකලට වට මහ වරුසාවක් සේ" ගීතය නෙරංජලා සරෝජනී වෙනුවෙන් නිර්මාණය කිරීම පෙනවා දිය හැකිය. මෙම සියලු නිර්මාණවල පොදු ලක්ෂණය වන්නේ ඇය වචනයේ භාෂා රිද්මය (prosody) සංගීතයට පරිවර්තනය කිරීමේ දී පෙන්වූ අසාමාන්‍ය නිරවද්‍යතාවයයි.

## අන්තර් සංස්කෘතික සහජීවනය හා විවේචනය

නන්දා මාලනී සිය නිර්මාණකරයේ දී දැක්වූ සුවිශේෂීම දක්ෂතාව වන්නේ ගායනය සඳහා ගී පද තෝරා ගැනීමේ දක්ෂතාවයි. ඒ අතරින් සංහිදියාව වැනි විෂයක් වෙනුවෙන් ගීත තෝරා ගැනීමේ දී අතිශය පරෙස්සම් විය යුතු අතර එහි දී කිසිදු ජාතිවාදීත්වයකට යට නොවී සිටීමේ හැකියාව ප්‍රගුණ කළ යුතුය. ඇය ගී කර කියූ කවි වෙනුවෙන් ගායනා කළ ජයවඩු විතානගේ 'තල් කොළයයි පොල් කොළයයි' ගීතය මීට නිදසුනකි.

කිසිදු සංස්කෘතියකට පක්ෂපාතී නොවී, ඒවායේ ආධානග්‍රාහී ලක්ෂණ විවේචනය කිරීමට ඇය සමත් වූවාය. සිංහල දැරියකගේ නව යෞවනයේ උද්යෝගිමත් හැඟීම දෙස දිළිඳු මවක් දැඩි ශෝකයෙන් මෙන්ම සෙනෙහසින් බලන බැලමක් ලෙස නිර්මාණය කරන ලද ලූෂන් බුලත්සිංහල ලියූ 'පිපුණු මගේ රුව' ගීය මෙන්ම දෑවැදි දීම නම් අධානග්‍රාහී චාරිත්‍රය යෞවන දැරියන්ගේ ජීවිත විනාශ කරන ආකාරය දෙස කෝපය මුසු බැල්මෙන් බලන පෙම්බර ලංකා කැසටයේ එන රන්තාලි මාලා ගීතය මීට කදිම උදාහරණ දෙකකි. සංකර සිරිත් විරිත් විසින් තරුණ පරපුර පාරිභෝජනවාදී උන්මාදයක් කරා රැගෙන යන ආකාරය ඇය 'යනවා නම් අනේ මං අරන්' ලෙස ගැයුවාය. පවන කැසට් පටයේ එන 'බුදුනේ ජේසුනේ' ගීයද මේ සංකල්පය කිසියම් ආකාරයක උත්ප්‍රසයකින් ප්‍රකාශ කිරීමකි.

## ආදරය හා විරහව

සිංහල ගීතයේ ජනප්‍රියම තේමාව වන ආදරය හා විරහවද ඇය තරම් ගැඹුරින් ගායනා කළ අන් ගායකයෙක් හෝ ගායිකාවක් නැති තරම්ය. ආදරයේ සරල මෘදු බවේ සිට ගැමුරු මානව බැඳීමද ඇය ගායනා කළාය. 'ඔබයි රම්‍ය සඳ කිරණ', 'කලා වැවෙන් ගත් දිය දෝතක් සේ' වැනි ගීත ආදරයේ බැඳීම වර්ණනා කරන අතර 'තරුද නිදන මහ රෑ', 'දෙනෝදාහක නුවන් අතරේ', 'කුරුටු ගෑ ගී පොතේ' වැනි ගීත විරහව පිළිබඳ හැඟීම් දනවයි. ස්ත්‍රී පුරුෂ ප්‍රේමයේ සුන්දරත්වය 'අහස සේ ඔබ අනන්තයි' ගීයෙන් පවසා, කාලයගේ ඇවෑමෙන් එහි සිදුවන හැල හැප්පීම් 'මගේ සඳ ඔබ' ගීතයෙන් ගායනා කළාය. වෙනස් ආකාරයක ආදරයන් දෙකක් ගැන ඇගේ ගීත ද්වයක් කැපී පෙනේ. 'කඩ මණ්ඩියේ දොල අයිනේ' ගීයෙන් කිසිදා යථාර්ථයක් නොවන ආදරයක් ගැන කියන ඇය 'මන්ද නාව කාරණාව' ගීයෙන් තමාට වඩා බාලයකු කෙරෙහි සෙනෙහෙන් බැඳුණු ස්ත්‍රියකගේ හැඟීමක් පවසයි.

ප්‍රේමය යනු හුදු හිමිකර ගැනීමක් ගැන යමක් නොව ඉන් ඔබ්බට ගිය ගැඹුරු සංකල්පයකි. ඒ දෙස, විඳින්නාගේ භූමිකාවෙන් ඔබ්බට ගොස් නිරීක්ෂකයෙකුගේ භූමිකාවෙන් නිර්මාණය කළ ගීත දුර්ලභය. ආදරය ලබාගෙන විඳ ගැනීම මෙන්ම විරහව තුළින් කියවෙන්නේ ආදරය තුළ සිටින කෙනෙකුගේ දෘෂ්ටිකොණයෙනි. නන්දා මාලනී ගැයූ බොහෝ ප්‍රේම ගීත තෙවැන්නාගේ දෘෂ්ටිකෝණය ඔස්සේ නිර්මාණය වූ ගීත වේ. 'ප්‍රේමය නම් මනරම් කවි කම් දෙන', 'ප්‍රේමය නම් රාගයෙන් තොර', 'වාසනාව ඇගේ නෙතයි' වැනි ගීත මීට උදාහරණය. ඇය ආදරය අතිශය උත්කර්ෂයට නැගූ ගීයක් ලෙසට 'අහස සේ ඔබ අනන්තයි' ගීය හඳුනා ගත හැකිය.

නන්දා මාලනී සිය නිර්මාණකරයේ දී දැක්වූ සුවිශේෂීම දක්ෂතාව වන්නේ ගායනය සඳහා ගී පද තෝරා ගැනීමේ දක්ෂතාවයි. ඒ අතරින් සංහිදියාව වැනි විෂයක් වෙනුවෙන් ගීත තෝරා ගැනීමේ දී අතිශය පරෙස්සම් විය යුතු අතර එහි දී කිසිදු ජාතිවාදීත්වයකට යට නොවී සිටීමේ හැකියාව ප්‍රගුණ කළ යුතුය. ඇය ගී කර කියූ කවි වෙනුවෙන් ගායනා කළ ජයවඩු විතානගේ 'තල් කොළයයි පොල් කොළයයි' ගීතය මීට නිදසුනකි.

## විරෝධාකල්පය

නන්දා මාලනී විසින් ගායනා කළ විරෝධාකල්ප ගී ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්; 1. දේශපාලන විරෝධාකල්ප සහ 2. ක්‍රම විරෝධය වශයෙනි.

## දේශපාලන විරෝධාකල්පය

දේශපාලනය යනු කිසිවෙකුටත් මග හැර යා නොහැකි, ජීවිත සමග සමීපව බද්ධව පවතින විෂයකි. නිදහසට පෙර මෙන්ම නිදහසින් පසු මෙරට පාලකයින් බවට පත්වූ පිරිස් විසින් අනුගමනය කළ මූලික උපක්‍රමයක් වන්නේ ජනතාවට දේශපාලනය එතරම් අදාළ නැති විෂයක් බව පෙන්වීම හා ජනතාව හැකිතාක් දුරට දේශපාලනයෙන් ඈත්කර තැබීමයි. එම උපක්‍රමය තුළින් තමා සහ සිය සහතර කණ්ඩායම් පමණක් දේශපාලනය තුළ "සජීවීකරණය කර තබා ගැනීමට" මෙම පිරිස ක්‍රියා කළහ. මෙසේ අඛණ්ඩව වර්ධනය කරගත් දේශපාලන වළල්ල දේශපාලකයා, පරිවාර දේශපාලකයා, දූෂිත ආගමික සංස්ථාවන්, දූෂිත ව්‍යාපාරිකයා, දූෂිත රාජ්‍ය නිලධාරීන්, දූෂිත නීතිය බලාත්මක කරන කණ්ඩායම් (විශේෂයෙන්ම පොලිසිය) හා මත නිෂ්පාදකයින්ගෙන් (ජනමාධ්‍ය, කලාකරුවන් වැනි කණ්ඩායම් ප්‍රමුඛ) සමන්විත විය. යමෙකු දේශපාලන වෙනසක් අපේක්ෂා කරන්නේ නම් මෙම සමස්ත කණ්ඩායමට එරෙහිව අරගල කළ යුතු විය. නන්දා මාලනී විසින් ගැයූ ගීත නිර්මාණ ඔස්සේ දේශපාලන විරෝධය ගොනු කරන ලද්දේ මෙම දේශපාලන බලවේගයට එරෙහිවය.

ඇගේ සත්‍යයේ ගීතය, හේමන්තයේදී යන කැසට්වලින් ඇරඹී පසුව පවන ප්‍රසංගය තුළින් උච්චස්ථානයක් කරා රැගෙන ගියේ මෙකී දේශපාලන ප්‍රතිවිරෝධයයි. මෙකී සංස්ථාවන් අතර අන්තර් සබඳතාව සමීපව නිරීක්ෂණය කරමින්, මතු පිටට නොපෙනෙන සියුම් තැන විනිවිදීම මෙකී නිර්මාණයන්ගේ විශේෂත්වයයි. මෙහිදී පද රචනයන් මෙන්ම සංගීත නිර්මාණයන් සුවිශේෂී කාර්යයක් ඉටු කළේ වුවද, එහි රිද්මය, හරය සහ ගැඹුරු පණිවිඩයේ වාහකයා නන්දා මාලනී නම් ගායිකාව බව විවාදයක් නැත.

## ක්‍රම විරෝධය

පවත්නා ක්‍රමය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට කැමැති දේශපාලන විවේචක බලකාය විසින් උලුප්පා දක්වන ලද දේශපාලන විරෝධාකල්පය විවේචනය විසින් යටපත් කරන ලද වැදගත් කොටස වන්නේ නන්දා විසින් ගැයූ ක්‍රම විරෝධයයි. ඇය දේශපාලන විවේචන තරමටම සාම්ප්‍රදායික ක්‍රමයද විවේචනය කරමින් ගීත ගායනා කළාය.

ආගමික සංස්ථා තුළ දුප්පත් හා බෙල හීන පිරිසට විඳින්නට සිදුවන අකටයුතුකම් හා පීඩනය ඇසුරින් ඇය පානම් පත්තුවේ ඩිංගිරි අම්මාය, උපාසකම්මා ඉපදුනු හීන කුලේ වැනි ගීත ගායනා කළාය. නීතය හා යුක්තිය සැමට සමානව ක්‍රියාත්මක වීම ශිෂ්ට සමාජයක අරමුණ වුවද එය එසේ නොවන බව හුවා දක්වමින් 'සීතල පොළවම', 'යදමින් බැඳ' වැනි

11 වැනි පිටුවට



"මා ගයන්නේ නිකම්ම ගැයීමට හෝ මට හොඳ කටහඬක් ඇති නිසා හෝ නොවේ. මා ගයන්නේ මගේ ගිටාරයට නිශ්චිත අරමුණක් සහ සාධාරණ හේතුවක් (යුක්තියක්) ඇති බැවිනි."

**වික්ටර් හාරා**
**Manifiesto**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට එන්න සුපුරුදු පරක්කුව අතරෙ ළමයි හෙණ සංවාදෙ... මොකද්ද සංවාද කරන්නෙ කියල. එක එක්කෙනා එක එක යෝජනා ගේනවා... එතනම නිෂ්ප්‍රභා වෙනවා. ආයෙත් යෝජනා එනවා. කලබලේ අතරෙ කවුරු හරි '22 ගැන කතා කරමු' කියල කියනකොට 'අන්න හරි අපි 22 ගැන කතා කරමු' කියලා අයිතිකාරයො ගොඩක් මතු වුණා.

"මොකක්ද අනේ 22 ගැන කතාව" අනුරුද්දිය ටියුබ් ලයිට්.

"මොකද්ද ළමයිනේ ගෝසාව. මොන 22ක් ගැනද ඔය ළමයි කතා කරන්න යන්නෙ...?" මේ අල්ල පනල්ලෙ පංතියට ගොඩවුණ පොලිටික්කගෙ කණ රබර්ද කොහෙද... ඒකත් ඇහිල.

"නෑ සර්... අපි කතා වුණේ සැප්තැම්බර් 22 ගැන"මංජුව විහිළුවට වගේ කිවුවෙ පස්සෙ හරි කතාව කියන්න බලාගෙන.

"මොකෝ ළමයිනේ සැප්තැම්බර් 22 සාහිත්‍ය දිනේද?" පොලිටික්ක තව ඊතලයක් අහම්බෙට විදල බැලුව.

"නෑ සර්... සැප්තැම්බර් 22 කියන්නේ ඡන්ද ප්‍රතිඵල දීපු ඓතිහාසික දවස" මංජුව මල්ලට තවත් ගැටයක් දැම්ම.

"මොන ඡන්දයක්ද?" පොලිටික්ක ඇහුවෙ හැරෙන තැපෑලෙ.

"තියන්න ඡන්දෙකුත් නෑ... කියන්න ප්‍රතිඵලේකුත් නෑ..." සමන ප්‍රසිද්ධ පරණ කතාවකට ඈඳපු එකට පංතියටම හිනා පැන්නට පොලිටික්කගෙ මූණ ඇද වුණා.

"ඇයි සමන් හිනා වෙන්නෙ. මොකද්ද ඔයාලා ප්‍රතිඵල ආපු දවස කියන්නෙ" පොලිටික්ක කිවුවෙ නෝක්කඩුවෙන්.

"ඇත්තටම සර් එදත් ප්‍රතිඵල ආවා තමයි. ඒත් තාම ප්‍රතිඵල ලැබෙනවා. කට්ටිය පෝලිමේ ඇතුලට යන්නෙ ඒකනෙ. සහසුද්දෙන්ම කිවුවොත් 2024, අවුරුදු දෙකකට කලින්, සැප්තැම්බර් 21 තිබ්බ ඡන්දෙ ප්‍රතිඵල ලැබුණෙ 22 තමයි. ඒත් කිවුව වගේම ඡන්දෙ ප්‍රතිඵල තාම එනවා. ඒවා දිගටම ඒවි" සමන ගැටේ බාගෙට ලෙහුව."කෝ හොරු ඇල්ලුවද කියලා ඇහුවා. ඕකම තමයි රනිල්ගෙ ආණ්ඩුව කළේ කියලත් කිවුව. මාධ්‍ය සංදර්ශන විතරයි කිවුව. අන්තිමට හොරු එළියෙ කිවුව. හැබැයි දැන් නම් වෙන්නෙ හොරා පොලිස් සෙල්ලම නෙමෙයි කියල කට්ටියට හොඳට තේරෙනවා"

"දැන් කියනවා නේද දේශපාලන පලිගැනීම් කියල. කරපු වැරදිවලට නීතිය ක්‍රියාත්මක වෙනකොට 'බලන්න අපෙන් පලිග න්නවා' වගේ කෙඳිරිගාන්න ලැජ්ජ නැද්ද දන්නෑ?"කනියටත් ලැජ්ජාව ගැන ප්‍රශ්නයක්.

"ලැජ්ජාවක් තියෙනව නම් ඔහොම ලැජ්ජ නැති හොරකම් කරයියෑ"මංජුව උගුණ පූර්ණයක් කළා. "හොරකම් කරනකොට ලැජ්ජාවක් තිබිලත් නෑ... දැනුත් නෑ"

"ඔයාලා දන්නවද?... ඊටත් වඩා ලැජ්ජ නැති වැඩක් තියෙනවා" සමන හයියෙන් කියනකොට හැමෝම ඒ පැත්තට හැරුණා. "යූඑන්පිය එයාර්බස් කොමිස් වංචාවට නාමල් මහත්තයා අත්අඩංගුවට ගත්ත එක වැරදියි කියලා නිවේදනයක් ගැහුවා. එයාලට අමතකයි එයර්බස් වංචා කේස් එකට නඩු පටන් ගත්තෙ එයාලගෙ කාලෙ කියලා. එයාලා මේ පරීක්ෂණ පටන් ගන්න ඇත්තෙ සෙල්ලමටනෙ... හිතුවෙ නෑනෙ හිරදඬුවම් දෙන්න තරම් දුරට ගෙනියන්න. යහපාලනේට ඡන්දෙ දීපු මිනිස්සු රවට්ටන්න තක්කඩිකමට පොඩි රඟපෑමක් කරන්න තමයි ඉඳලා තියෙන්නෙ. ඒකනෙ දැන් නීතිය ක්‍රියාත්මක වෙන එක වැරදියි කියන්නෙ. අනික යූඑන්පියෙ සංවත්සරේදි රනිල් කියනවා ඩී.ඒ. රාජපක්ෂ යූඑන්පියෙ ආරම්භක සාමාජිකයෙක්ලු. දැන් හිරේ දාලා තියෙන්නෙ එයාගෙ මුණුබුරාලු. එයා වචනවලින් නොකිවුව ඒත් එයාගෙ හිතේ තිබුණ කතාව මම කියන්නම්" සමනා ඩෙස් එකක ගැට්ටෙ හරිබැරි ගැහුණා. 'අපිල වගේ ප්‍රභූ අය... අපිලගෙ දරුවො... අපිලගෙ මුණුබුරෝ හිරේ විලංගුවෙ වැටෙන්න ඕනෙ අය නෙමෙයි... එහෙම වෙන එක හොඳ නෑ... හැබැයි දැන් මේ ආණ්ඩුව අපේ ප්‍රභූකම ගණන් ගන්නෙ නැතුව හැම එකාටම ක්‍රියාත්මක කරන නීතිය, අපිටත් ක්‍රියාත්මක කරන්න පටන් අරන්... මේ සෙල්ලම හරියන්නෙ නෑ. ඒ නිසා අපි ඔක්කොම එකට එකතුවෙලා මේක නවත්ත ගන්න ඕනෑ' මේක තමයි රනිල් නොකියා කියන කතාව. කලින් නොතිබුණු ඩී.ඒ. රාජපක්ෂලගෙ ෆොටෝ යූඑන්පී ස්ටේජ් එකට එන්නයි... මල් මාලා දාන්නයි... කතාවලදි එයාලගෙ මුණුබුරන්ගෙන් පලිගන්නවා වගේ අදහස් කියන්නයි පටන් අරන් තියෙන්නෙ ඒකනෙ"

"අපි ඇත්තටම කියන්න ගිය 22ට වඩා මේ කතාව නැගල ගියා නේද සමන්" මංජුව කිවුවෙ ඇහැක් ගහන ගමන්.

"එතකොට ඔය ළමයි ඇත්තටම 22 කියල කියන්න ගියේ මොකක්ද?" පොලිටික්කට තවත් ලැජ්ජ නෑ.

"22වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ගැන සර් කතා කරන්න හිටියෙ. දැන් ඒ ගැන කතා කරන්න ගත්තොත් හෙට වෙයි නේද සර්?" සමන දිගඇරපු පොත වහනව වගේ අභිනයෙන් පෙන්නුව.

කවුළුව හැරී තබමී

# මේ සැප්තැම්බර් මාසයයි...

සැප්තැම්බර් මාසය බොහෝ විට හඳුන්වන්නේ සාහිත්‍ය මාසය කියාය. ඇත්තටම සාහිත්‍ය හා කලාව එක මසකට පමණක් සීමා විය යුතුද, යන්න වෙනම සාකච්ඡා කළ යුතු කරුණකි. වරක් ලූනචාස්කි කී පරිදි කලාවට, සාහිත්‍යයට ජීවිතයෙන් සහ දේශපාලනයෙන් වියුක්තව සිටිය නොහැක. එවැනි වියුක්ත කලාව යනු කුහකකමක් සහ හුදු ප්‍රබන්ධ කාරණයක් පමණක්ම බව ඔහු තවදුරටත් පවසා සිටියේය.

වඩා ශ්‍රේෂ්ඨ සමාජමය අරමුණුවලට සේවය කරනු සඳහා සාහිත්‍ය හා පොදුවේ කලාව යෙදවීමටත්, තමා වටා පවතින අරාජික ලෝකය තුළ සුසංවාදය හා රීතිය ගොඩනැංවීමටත් මිනිස් කලාකරුවන්ගේ අරමුණ විය යුතු බව ට්‍රොට්ස්කිද පවසා ඇත. අසාමාන්‍ය සාහිත්‍යකරුවා විසින් ක්ෂණික අරගලවලින් ඔබ්බට යන්නාවූ සත්‍යය දිවැසින් මෙන් දැක බලාගෙන අනාවරණය කළ යුතු යැයි ඔහු තවදුරටත් අවධාරණය කරයි.

මෙය අපේ රට යහපත් දිශාවකට පරිවර්තනය වෙමින් පවතින මොහොතකි. එනිසාම මේ අවදියේ කලාකරුවාට පැවරෙන කාර්යභාරය අති විශාලය; බැරෑරුම්ය. එය හොඳින් කියවා තේරුම් ගත් සාහිත්‍යකරුවාට කලාවාරුවාට ඒ සඳහා කළ හැකි මෙහෙය සුළු පටු නොවේ. දේශපාලකයන්



පුම්බන කලාවක් හෝ ඔවුන් පසුපස තම මඩිස්සලය අල්ලාගෙන ගාටන කලාකරුවෙක් හෝ මේ සමාජය දැන් කිසිසේත්ම අපේක්ෂා නොකරයි. කලාව හො සාහිත්‍ය ජීවිතය තුළට කැඳවාගෙන එන කලාකරුවෙකුය, දැන් අවශ්‍ය වන්නේ.

සැබෑ ජීවමාන මිනිසුන්ව මනඃකල්පිත ආදර්ශ ආකෘති මගින් විස්ථාපනය කරන සාහිත්‍යයක් හෝ කලාවක් වත්මන් සමාජ අර්බුදය විසින් ඉල්ලා නොසිටි කලාව හා සාහිත්‍යය සැබෑ ජීවමාන මිනිසුන්ගේ ආධ්‍යාත්මික අවියක් විය යුතුය. එය ඔවුන්ගේ හිසට උඩින් වනන දිදුලන අවියක් නොවේ. මිනිසුන්ගේ ජීවිතවලට ප්‍රඥාවේ ආලෝකය හා ප්‍රබෝධය ගෙන ආ හැකි අවියකි. සාහිත්‍ය මාසය තුළ එය සිහියට ගෙන කලාවට බැසීම කලාවේ ඉදිරි පැවැත්ම සඳහා විය යුතුම දෙයයි.

# කළු කබායේ අඳෝනාව...



මේ ආණ්ඩුවට විරුද්ධව විවිධ අඳෝනා නගන කල්ලි ගණනාවක් ඇති අර මෑතදී එළිබැහැපු අය අතර මේ දිනවල විශාල ලෙස අඳෝනා නගන කල්ලිය වී ඇත්තේ එක්තරා නීතිඥ කල්ලියකි.

මේ අඳෝනා නගන කල්ලිවල පැටිකිරිය මඳක් විමසා බැලූ කළ පෙනී යන පොදු ලක්ෂණයක් තිබේ. එනම් ව්‍යතිරේකයන් තිබිය හැකි වුවද මේ රටේ කුජිත වී ගිය, කුණු වී ගිය ජනතාවගේ අතිශය අප්‍රසාදයට ලක්වූ ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ කුමන හෝ දේශපාලන කල්ලියකට ඔවුන් සේවා සපයන්නන් බවයි.

ජාතික ජන බලවේගය හැර මෙතෙක් පැවති හැම ආණ්ඩුවක්ම මේ රටේ නීතිය තමන්ගේ භුක්තියට ගෙන එය මුළු ලෝකයා ඉදිරියෙහිම මස්තබාල්දු කළ හැටි නැවත නැවත උදාහරණ ගෙන පහදා දිය යුතු නැත. එම අවස්ථාවලදී අර කළු කබා කල්ලිය අඳ, ගොලු, බිහිරන් සේ මුනිවත රැක්ක අයුරුත් මේ රටේ ජනයාට අමුතුවෙන් පහදා දිය යුතු නැත. මේ කලබලය වෙන කිසිවක් නිසා නොව තම රදළ ස්වාමිවරුන්ට ඉදිරියේදී නීතිය හමුවේ අත්වීමට නියමිත ඉරණම දැක හා දැන ඔවුන් එයින් ගලවා ගැනීම වෙනුවෙන් කළු සළු වුවද උනා දැමීමට සූදානම් බව ප්‍රදර්ශනය කිරීම සඳහා තිබෙන කලබල යයි.

නීති වෘත්තියද ගරු කටයුතු වෘත්තීන් අතර එකකි. නමුත් මේ කල්ලිය කරන්නේ නීති වෘත්තීයේ ගරුත්වය රකින බොහෝ නීතිඥවරුන්ටද නිගා දෙන සෙල්ලමකි. ජීවිතයේ පරම අර්ථය බවට තම බඩවියත රැකගැනීම පත්කර ගත් අයෙකුට මොන තරම් ගරු කටයුතු වෘත්තියක් වුවද මස්තබාල්දු කිරීම එතරම් ගැටලුවක් නොවේ.

තම ශරීරවලට දේශපාලන ඕජස් පිරි ඔළුවක් දරා ගැනීමට සිදුවීමේ ඛේදවාචකයට කෙනෙකු ගොදුරු වූ විට, ඔහු මොනතරම් උසස් යයි සම්මත වෘත්තියක නියැලී සිටියත් මුළු වෘත්තියම ගඳගස්ස වන්නේය. එනිසා මේ කුණුකන්දල් දේශපාලනය හා දේශපාලුවන් තම හිස උඩ තබාගෙන මේ රට නැවත වළපල්ලට ගෙනයාමට දරන උත්සාහයට එරෙහිව නැගී සිටීම මේ රටේ ප්‍රගතිශීලී නීතිඥ මහත්වරුන්ගේ වගකීමක් බව අපි විශ්වාස කරමු.


# අපරාධ රාජ්‍යයේ බිඳවැටීම...

"අපරාධ රාජ්‍යයේ කළු කුහරයට අපි ඇතුළු වුණා. මේ ගමනේදී ආපසු හැරීමක් නැහැ. මේ රටේ මව්පියන්ගේ ප්‍රධානතම ඉල්ලීම තමයි තම දරුවන් මේ අපරාධ රාජ්‍යයේ අපරාධ හා මත් රකුසාගෙන් බේරා දීම. අපරාධ රාජ්‍යය හා මත්ද්‍රව්‍ය ජාවාරම මුලිනුපුටා දමා මෙරට ජනතාවට හා අනාගත දරුවන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කර මිස අප ආපසු හැරෙන්නේ නැහැ" මේ අපේ ජනාධිපති අනුර කුමාර සහෝදරයා මීට ටික කලකට පෙර මහනුවරදී ප්‍රකාශ කළ වදන්ය.

දැන් එය වේගයෙන් ඉටුවෙමින් තිබේ. මෙය අපරාධ රාජ්‍යයේ රජවරුන් සේ වැජඹුණු එහි කළු සල්ලි මත දිය බුං ගසමින් සිටි රාජපක්ෂ කල්ලිය ප්‍රමුඛ හිටපු පාලක ජුන්ටාවන් තම දෑස් ඉදිරිපිට එය කඩා වැටෙන අයුරු දැක තම හද පත්ලෙන් නැගෙන වේදනාව දරාගත නොහැකිව වෛරයේ හා වේදනාවේ අඳෝනාව පිටකරමින් සිටින මොහොතකි.

දැන් මේ සාපරාධී දම්වැලේ ප්‍රබලම පුරුක් අතර අත්අඩංගුවට ගෙන පෝලිමේ කුදලාගෙන ඒමට මේ ආණ්ඩුව පියවර ගෙන තිබේ. මේ අපරාධ ජාලයේ මූලයන් හඹාගොස්
එහි ගෝඩ්ෆාදර්ලා පෝලිමේ බන්ධනාගාර ගත කෙරෙමින් සිටිති. මේ ළඟකදී විදේශයක සිට මෙරටට රැගෙන ආ ප්‍රබල පෙළේ මත්ද්‍රව්‍ය ඒජන්තයෙකු ප්‍රකාශ කර තිබුණේ තමන් පසුගිය මැතිවරණවලදී දැනටත් විපක්ෂයේ ප්‍රධාන පෙළේ පක්ෂ කිහිපයකට ප්‍රචාරක කටයුතු සඳහා අතිවිශාල මුදල් කන්දරාවක් ලබාදී ඇති බවයි. මෙරට දුගී දුප්පත් අහිංසක ජනතාව රවටා ඔවුන්ට බත් පැකට් එකක් සහ බොන්නට මත්පැන්ද ලබාදී අතට කීයක් හරි සන්තෝසම් ලෙස දී ඉහත විපක්ෂ දේශපාලුවන්ගේ රැලිවලට සෙනග ඇද තිබෙන්නේ එලෙස අපරාධකරුවන්ගේ කළුසල්ලිවලින් බවද දැන් අනාවරණය වෙමින් තිබේ.

දැන් මේ අපරාධකරුවන්ගේ සහ මත්ද්‍රව්‍ය ජාවාරමුන්ගේ




ස්වාමිවරු කැළඹී සිටින්නේ එනිසාය. ඔවුන්ට මේ ආණ්ඩුව ඉක්මනින්ම පෙරළා ගැනීමට අවශ්‍ය වී තිබෙන්නේද ඒ නිසාය. ඔවුන් ඒ සඳහා ඕනෑම අපරාධයක යෙදීමට දෙවරක් හිතන්නේ නැත. දැන් මේවායේ ස්වාමිවරු දෙකොණ රත්වූ උන්මන්තකයින් සේ හැසිරීමට පටන්ගෙන සිටිති. පාර්ලිමේන්තුව ඇතුළේත් පිටතත් ඔවුන් මේ රඟන්නේ තම අවසන් රංගනය බව ඔවුන්ටම වැටහී ඇති සේය. එනිසා හැකි සෑම ආකාරයකින්ම මේ ආණ්ඩුවට සහ ජනාධිපති සහෝදරයාට දන්නා සියලු අවලාද, මඩ, අපහාසවලින් දමා ගසා මේ ආණ්ඩුව පෙරළා දැමීමට වළිකන්නේ ඒ නිසාය. එහෙත් මෙය මේ රටේ ප්‍රථම ජනතාවාදී ආණ්ඩුව බව මේ උන්මන්තකයින් විසින් මතක තබාගත යුතුය. මේ රටේ පොදු ජනතාව එය දිවි හිමියෙන් රකිනු ඇත.

# රට වෙනස් කිරීමේදී ...

12 පිටුවෙන්..

ගැන සලකා බලමු. ඔහු ඉතාමත් මැනවින් උපාය උපක්‍රම තේරූ පුද්ගලයෙක්. කොයි ආකාරයකින් කියනවා නම්, ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා මාක්ස්වාදියෙක් වුණත් 1953 කාලයේ දේශපාලනය ක්‍රියාරිත්වයට නැගුවේ මාක්ස්වාදියෙකු හැටියට පෙනී සිටිමින් නොවේ. ඒ කාලයේ තිබුණු එරට කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක්වත් වෙලා හිටියේ නැහැ. නමුත් ඔහුගේම වචනවලින් කියා තිබුණේ "මාක්ස්වාදය මට සමාජය කුමක්දැයි ඉගැන්වූවා. මම ඊට පෙර සිටියේ දැස් බැඳ උතුර දකුණ සොයාගත නොහැකිව මහා වනයක අතරමංවූ අයෙකු ලෙසයි. ඔබ සැබෑ ලෙසම පන්ති අරගලයේ ඉතිහාසය තේරුම් ගන්නේ නැතිනම් අඩුම ගානේ සමාජය පොහොසත් සහ දුප්පත් ලෙස බෙදී තිබෙනවාය, යන්නවත් තේරුම් ගත්තේ නැති නම්, වනාන්තරයක අතරමං වෙනවා." කියලයි. ඒ වගේම කුඩා මාක්ස්වාදී කවයක් හදලා අධ්‍යයන කටයුතු කරගෙන ගියා. නමුත් ඔහු කොමියුනිස්ට් පක්ෂයක් හදන්න ගියේ නැහැ. කොමියුනිස්ට්වාදී සමාජවාදී කියන නම් ගත්තෙත් නැහැ. ඒ මොහොතේ තිබුණු සමාජයේ තත්වය තේරුම් ගෙන වැඩ කළා. ඒ නිසා බැටිස්ටා විරෝධී බලවේගය ඒකරාශී කර ගත්තා.

මුලදී ඔවුන්ගේ සංවිධානයට නමක් වත් තිබුණේ නැහැ. 1953 ජූනි 26 වැනිදා මොන්කාඩා බැරැක්කයට ප්‍රහාර එල්ල කිරීමෙන් පස්සේ "ජූලි 26 ව්‍යාපාරය" යන නමින් පෙනී සිටියා. බලය ගත්තෙත් ඒ නමින් පෙනී සිටිමින්. උපක්‍රමික දේශපාලනයේ ඉතාම හොඳ ආදර්ශයක් මේ මගින් සපයා තිබෙනවා. 1958 පෙබරවාරි 17 වැනිදා වන විට ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා ඇතුළු පිරිස රැඳී සිටි සියෙරා මහේස්ත්‍රා කඳුකරයට නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතේ හර්බට් මැතිව්ස් කියන පුවත්පත් කලාවේදියා ගෙන්වා ගත්තා.



ෆිදෙල් ඔහුත් සමග සාකච්ඡාවක් කළා. මාධ්‍යවේදියා අහනවා ඔබේ සටනේ අරමුණ මොකක්ද කියලා. කරුණු තුනකින් ෆිදෙල් තමන්ගේ අරමුණ කීවා. ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරන බව කීවා. අපි හොඳට විග්‍රහ කර ගත්තොත් මේ කරුණු තුනම සමාජවාදයේ මූලධර්ම බව පැහැදිලි වෙනවා. කියුබානු විප්ලවීය ජයග්‍රහණයෙන් පස්සේ එක්සත් ජනපදය දියත් කළ කඩාකප්පල්කාරී ක්‍රියාවලට එරෙහිව 1961 අප්‍රේල් 16 වැනිදා දැවැන්ත රැලියක් පැවැත්වූවා. ඒ රැලියට සහභාගී වූ ලක්ෂ ගණනක් ජනතාවගෙන් ෆිදෙල් ප්‍රශ්න කිහිපයක් ඇසුවා. පසුගිය කාලයේ සිදුකළ නාගරික සංවර්ධනය ඔබ අනුමත කරනවාද? මිනිස්සු එය අනුමත කරන බව කීවා. එහෙම නම් අන්න ඒක සමාජවාදය, බව ෆිදෙල් කීවා.

ඒ වගේම කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුමත කරනවාද, යනුවෙන් අසා, ජනතාව අනුමත කරන බව පැවසීමෙන් පසුව එම ක්‍රියාමාර්ග සමාජවාදී ක්‍රියාමාර්ග බව කීවා. ඒ විතරක් නොවෙයි, ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා කියුබාවේ කොමියුනිස්ට් පක්ෂය නිර්මාණය කරන්නේ 1965දී.

මේ කරුණුවලින් පැහැදිලි වෙන්නේ ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා නිකම්ම සටන් පාඨ කියූවෙක් නොවෙන බවයි. සමාජයේ චින්තනය, බලවේගවල ස්වභාවය, තේරුම් ගනිමින් දුෂ්ට පාලනය පෙරළා දමා අලුත් සමාජයක් බිහිකරන්න නායකත්වය දුන්නා. අපිත් මේ සමාජයේ සියලු බලවේග ඒකරාශී කරගෙන මේ සමාජය වෙනස් කරන්න යොදා ගන්නේ කොහොමද යන ආදර්ශය ගන්න පුළුවන්. ඒ වගේම විප්ලවය ගැනත් නිවැරදි අදහසක් ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයාට තිබුණා. "විප්ලවය යනු ඓතිහාසිකව පැන නගින්නක් මිස හිතුවක්කාරකමට හෝ පුද්ගල කැමැත්ත මත ඇති වන ප්‍රතිඵලයක් නොවේ. ඒ නිසා විප්ලවය කිසිවෙකුටත් වැළැක්විය නොහැකිවාක් මෙන්ම කිසිවෙකුටත් බලෙන් පැටවිය හැක්කක් ද නොවේ." කියලත් කීවා. ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා මාක්ස්වාදියෙකු වගේම දේශප්‍රේමියෙකුද වුණා. ඔහුගේ පරමාදර්ශය වී තිබුණේ කියුබානු ජාතික වීරයෙක් වූ, හොසේ මාටි. කැස්ත්‍රෝ සහෝදරයා එක වෙලාවක කීවේ, "මම දේශපාලනය, විද්‍යාව තේරුම් ගන්නේ මාක්ස්වාදයෙන්. මගේ ආධ්‍යාත්මය ගොඩනගාගන්නේ හොසේ මාටිගෙන්." කියලා. යහපත් සමාජයක් නිර්මාණය කරන්න යන ගමනේදී හොඳ අධ්‍යාත්මයක් නැත්නම් ඒ කාර්යය හරියට කරන්න බැහැ. ඒවගේම ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයාගේ තිබුණු සුවිශේෂී ගුණයක් තමයි ප්‍රතිපත්ති ගරුකභාවය. ඕනෑම කෙනෙකුට දවසෙන් දවස වෙනස් නොවෙන ස්ථාවර ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියාකළ යුතුයි. කියුබානු ජනතාවට කැස්ත්‍රෝ සහෝදරයා ලබා දුන් ඒ ආදර්ශය නිසයි මහා සම්බාධක මැද්දේ අදත් ඒ ජනතාව වැටෙන්නේ නැතිව කෙලින් ඉන්නේ.

දේශපාලනයේදී සමහරු කීර්තිය සොයාගෙන යනවා. තවත් සමහරු වරප්‍රසාද සොයාගෙන යනවා. තවත් සමහරු බලයට ආශා කරනවා. ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා මේ සියල්ල තමන්ගේ ජීවිතයෙන්ම බැහැර කරමින් ආදර්ශ ලබා දුන්නා. අපි වැඩකරද්දී ප්‍රසිද්ධිය අපේ පසු පස්සේ එන්න පුළුවන්. නමුත් ප්‍රසිද්ධිය බලාගෙන වැඩ කරන්න ඕනෑ නැහැ. හොසේ මාටි එක මොහොතක කියලා තියනවා "ලොව සියලුම කීර්තිය ඉරිඟු ඇටයක් තරම්." කියලා. ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා 'චේ' ගැන සඳහන් කළේ කීර්තිය පසුපස නොගිය කෙනෙක් හැටියට. නමුත් 'චේ' ගැන ඉතිහාසයේ පිටුවල ලියැවිලා තියෙනවා. අපිත් අපේ වගකීම් ඉටු කළ යුත්තේ අපේ පන්තිමය යුතුකමක් හැටියට සලකලයි. නැතිබැරි කෙනෙකුට මොනවා හරි එකක් දීලා මුහුණු පොතේ ෆොටෝ එක දාගන්න මානසිකත්වයෙන් කියැවෙන්නේ ඒ දෙන කෙනාගේ නැතිබැරිකමයි. එහෙම සමාජයක් වෙනස් කරන්න තමයි ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයාගෙන් ආදර්ශ ගන්න වෙන්නේ. කියුබානු ව්‍යවස්ථාවේම සඳහන් වෙනවා ෆිදෙල් සහෝදරයාගේ නමින් කිසිම දෙයක් සඳහන් නොකළ යුතු දෙයක් බවට. ෆිදෙල් සහෝදරයා මිය ගියාට පස්සේ අවශ්‍යතාවය මත ව්‍යවස්ථාවේ වෙනසක් කරලා ෆිදෙල් කැස්ත්‍රෝ කෞතුකාගාරය පිහිට වූවා. කියුබාව තුළ වෙන කිසි තැනෙක ෆිදෙල්ගේ නම නැතිවුණත් හැතැප්ම දහස් ගණනින් ඈතින් ඉන්න අපේ හදවත් තුළ ෆිදෙල් ජීවත් වෙනවා. එයා අපේ හදවතේ ඉන්න මට්ටමට වැඩ කරලා තිබෙනවා. වැඩ නැතිව ඉන්න හැල්ලු මිනිස්සු හැමතැනම නම් ගහගෙන යනවා. 'චේ' මියගියාට පස්සේ තමයි ඔහුගේ නමින් ආරක්ෂක මූලස්ථානය නම් කළේ. ඒ වගේ මිනිසුන් සමස්ත මානවයාගේ හදවත් තුළින් මකන්න බැහැ.

හතුරන් පවා ෆිදෙල් සහෝදරයාට ගරු කරන්නේ ඒ නිසයි. ෆිදෙල් සහෝදරයා රාජ්‍ය නායකයෙක් හැටියට සිටි කාලයේදී සෝවියට් රුසියාව බිඳ වැටීමෙන් පසු කියුබාවේ මානව හිමිකම් උල්ලංඝනය කළ බවට වඩාත් වැඩියෙන් චෝදනා කළා. ඒ අවස්ථාවේ ෆිදෙල් සහෝදරයා කළේ පාප් වහන්සේට තමන්ගේ රටට එන්න කියලා ආරාධනා කිරීමයි. පාප් වහන්සේ ඒ රටට ගියාට පස්සේ බන්ධනාගාර සියල්ල දැක බලා ගැනීමෙන් පසුව සිරකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කර, ඔවුන් සිදුකර තිබෙන අපරාධ සම්බන්ධයෙන් අධිකරණයෙන් ලබා දුන් තීන්දු පැහැදිලි කර දුන්නා. ඒ වගේම කියුබානු සරණාගත ප්‍රශ්නයක් ඇති වූ අවස්ථාවේ ෆිදෙල් සහෝදරයා කීවේ "අපි සමාජවාදය ගොඩනගන්නේ, සමාජවාදය ගොඩනැගීමට කැමති නිදහස් මිනිසුන්ගෙන්" කියලයි. ඊට අකමැති අයට කැමති දිහාවකට යන්න නිදහස දුන්නා. අපේ සමාජයේත් වෙනස්කම් කරන්න ගියහම ඊට අකමැති පිරිසගෙන් බාධා එල්ල වෙනවා. සරල උදාහරණයක් ගත්තොත් මත්ද්‍රව්‍ය, පාතාලය, නතර කරන්න ගියාම ඒවාගෙන් ප්‍රතිලාභ ගත් අයගෙන් විරෝධයන් එල්ල වෙනවා. ෆිදෙල් කියන්නේ විසි වැනි සියවසේ ලෝකයට සිටි ඉතාමත් දක්ෂ නායකයෙක්, රාජ්‍යතාන්ත්‍රිකයෙක්, සටන්කාමියෙක්. ඔහුගෙන් අපි රට වෙනස් කිරීමේ ගමනට අත්දැකීම් එකතු කරගෙන ලංකාව වඩා යහපත් තැනකට ඔසවා තබන්න කැපවෙමු.

# නන්දා මාලනී...

9 පිටුවෙන්..

ගීත ගායනා කළාය. 'ඉටි පහනක් දෝ' මා ගීතය තුළින් ගැහැනියක සමාජයේ මුහුණ දෙන අභියෝග ගැනත්, 'පිපුණු මලේ රුව' ගීයෙන් දිළිඳු මවකගේ හැඟීමත් ප්‍රකාශ කළාය. ඇගේ මිරිවැඩි සඟලක් ගීය සමාජය දෙස පාරිභෝජනවාදී මනසකින් තොරව බැලීමේ අවශ්‍යතාව අවධාරණය කළාය.

ආගමික සංස්ථාවන් විවේචනය කරන අතරම අන්ධ භක්තිය විවේචනය කිරීමටද ඇය ගීත ගයා ඇත. බෝ මැඩ වගුරන කිරි කළ දහසින් ගීය එවැනි නිර්මාණයකි.

නැලවිලි ගී නමින් යුත් ශානරය තුළ ඇය සිදු කළ වෙනසද මනරම්ය. 'චන්ද්‍ර මඬුළු යට සුරංගනාවන්' ගීයෙන් ඇය සාම්ප්‍රදායිකව දරුවන් තුළ පැලපදියම් කරන ආකල්ප විවේචනය කළාය. 'බාලොලී ලොලී කියා' ගීයෙන් වැඩිහිටියන් කුමක් පැවසුවද දරු පරපුර අවදියෙන් සමාජය දෙස බැලිය යුතු බව අවධාරණය කළාය. ප්‍රේමකීර්තිද අල්විස් ලියූ, 'සුරංගීට දුක හිතුණා' ගීයෙන් පියෙකුගේ ආදරය දෙස වෙනස් කෝණයකින් බලන්නට උත්සාහ කර ඇත.

## විවිධ තේමාවන්

නිර්මාණයන් විචිත්‍රවත් වන්නේ විවිධ තේමාවන් ඔස්සේ ඒවා පෝෂණය වන්නේ නම් පමණි. විශේෂයෙන්ම ගීතය වැනි කෙටි කාලයක් තුළ ශ්‍රවණය කර අවසන් වන නිර්මාණ අතරේ විචිත්‍රත්වය අතිශයින්ම වැදගත්ය. නන්ද මාලනී සිය නිර්මාණ තුළ මෙම විචිත්‍රත්වය රඳවා ගත්තාය.

ඇගේ නිර්මාණයන්හි සුවිශේෂීම ලක්ෂණයක් වන්නේ පොදු තේමාවන්ම තෙවැනි ඇසකින් බලමින් නිර්මාණ කිරීමයි. මව් ගුණ ගීයක සාම්ප්‍රදායික දෘෂ්ටි කෝණයෙන් නොබලා ධර්මසිරි ගමගේ ලියූ 'අම්මාවරුනේ' ගීය අම්මාවරුන් දෙස තෙවැනි ඇසකින් බැලීමකි. බණ්ඩාර ඇහැලියගොඩ ගජමන් ටෙලි නාට්‍යයට ගියූ 'ජීවිතේ කවියක්' ආදරය දෙස තෙවැනි ඇසකින් බැලීමකි. විජය ධර්ම ශ්‍රී ගේ දුහුළු මලක් චිත්‍රපටයේ 'රන් කෙන්දෙන් බැඳ' ගීය සාම්ප්‍රදායික නොවන ආදරයක් දෙස සාම්ප්‍රදායික නොවන ඇසකින් බැලීමට පොළඹවන තේමාවකි. 'රුවල් ඉරී ගිය නෞකාවේ' ගීතය ආදරවන්තියකගේ දෘෂ්ටියෙන් ලියවුනද, ඇය සරල, සාම්ප්‍රදායික, බොළඳ ආදරවන්තියකගේ භූමිකාවෙන් මිදී, යථාර්ථය තුළ හිඳිමින් සිය පෙම්වතා දෙස බැලීමට දැරූ උත්සාහයකි. 'පහන් කන්ද මුල අඳුරුයි', 'පෙරදා මහ රෑ', 'සංසාර සාගරේ' වැනි නිර්මාණ මේ තේමාවට නිදසුන්ය.

සරල ජීවිත අත්දැකීම්, වින්දනය හා ප්‍රඥා උද්දීපනය යන කරුණු දෙක කෙරෙහිම ඇය යොදා ගත්තාය. ඇතැම් නිර්මාණ ශබ්ද රසයට මුල් තැන දෙමින් නිර්මාණය වුවත් ඒවා සරලත්වයෙන්ම කෙළවර නොවීය. 'දීග නොගිය පුංචි නැනෝ' ගීය රබන් පද හඬ මුසව ගැයූ ගීයකි. ගැමි සමාජයේ ලිංගිකත්වය හා ශෘංගාරය ඇය එහි ගායනා කළාය. 'බුදු තාත්තේ බොන්න එපා' ගීයෙන් පියාගේ බේබදුකම දරුවෙකුට දැනෙන ආකාරය කියාපායි. 'හිතුමතේට දීග ගිය දුවේ' ගීයෙන් දෙමාපියන්ගේ අවසරයෙන් තොරව විවාප්‍රාප්ති දියණියකට මවගේ ආදරය නොසඟවා පළ කරන නිර්මාණයකි. දූ දරුවන් වැඩිවියට පත්ව, සිය ජීවිත ගත කිරීමේ දී හුදකලා වන දෙමාපියන් පිළිබඳව 'සුදු හාමිනේ නුඹ කොතනද' ගීයෙන් විෂද කරයි.

## සංගීතයේ දේශපාලනය

සංගීතය යනු ඓතිහාසිකව ප්‍රභූත්වය සමග වැඩි වර්ධනය වූ කලාවකි. සියලුම කලාවන් ඒ ඒ යුග තුළ පැවැතියේ ඒ සඳහා අනුග්‍රහය දැක්වූ ප්‍රභූන්ගේ ඇසුරේය. ඒ හේතුවෙන් කලාව නිතැතින්ම ප්‍රභූ සේවනය කරන අතර සාමාන්‍ය ජනතාවට ගෝචර නොවන මානයක ස්ථාපනය වී පැවැතුණි. මෙරට සීමිත සංගීත නිර්මාණ වන ප්‍රශස්ති, වන්නම් වැනි සංගීත නිර්මාණ රජ මැඳුරු ආශ්‍රිතව පැවැතියේය. සාමාන්‍ය ජනතායා අතර ප්‍රචලිත ජනකවිය හා පසුකාලීනව කෝළම්, රූකඩ වැනි නිර්මාණ ප්‍රාථමික සීමාවන් අතික්‍රමණය කළේ නැත. මෙය නන්දා මාලනී සංගීත ක්ෂේත්‍රයට පිවිසෙන අවස්ථාවේදී ද නොවෙනස්ව පැවැති යථාර්ථයයි.

එකී සම්පාද්‍රායේ නන්ද මාලනී සලකුණ වන්නේ ඇය ගීතය ප්‍රභූ පංතියෙන් කණ්ඩනය කර සාමාන්‍ය මිනිසුන්ගේ උරුමයක් බවට පත් කිරීමයි. ඇය අඛණ්ඩවම පැවැතුණේ ඍජු රාජ්‍ය අනුග්‍රහය නොලබන, සාමාන්‍ය මිනිසුන් සමග පවතින ගායිකාවක වශයෙනි. ඇගේ මරණයත් සමගම ඇයට විවේචන ඉදිරිපත් කළ කණ්ඩායම ඍජුවම ප්‍රභූ දේශපාලනය නියෝජනය කරන පිරිස වීමට හේතුව එයයි. එමෙන්ම දේශපාලන පක්ෂ භේදයක් නොමැතිව "සාමාන්‍ය මිනිසුන්" ඇය ඔසවා තැබීමට සම්බන්ධ වූහ. සංගීතයේ මෙම බෙදුම් රේඛාව සනිටුහන් කළ නිර්මාණකරුවන් රැසක් සිටියේ වී නමුදු එහි පුරෝගාමීත්වය නන්දා මාලනියට හිමි වීම අනිවාර්යයකි.

# අපි වැඩ කරන්නේ...

3 පිටුවෙන්..

අදාළ බොහෝ ආයතන හොඳින්ම ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. පරිපාලන අවුල් රැසක් තියෙනවා. ආණ්ඩුවට කොතරම් ඉක්මනක්, හදිසියක් තිබුණත් සමහර ආයතනවල වැඩ සිදුවන්නේ පරණ පුරුද්දට හිමින්. මේව තමයි අපට තිබෙන අභියෝග.

කොහොම වුණත් අපි මහජන ගැටලු විසඳීම ආරම්භ කරලා තියෙනවා. දිනපතා ඒ වෙනුවෙන් වෙහෙසෙනවා. කැපවීමෙන් වැඩ කරනවා. ඒ නිසා මේ සියලු ගැටලු විසඳිය හැකි බවට අපිට විශ්වාසයක් තියෙනවා.

***අවසාන වශයෙන් මාලිමා ආණ්ඩුවේ ඉදිරි ගමන හා ඉදිරි ඉලක්ක ගැන අදහසක් කිවුවොත්?***

ඔව්. මාලිමා ආණ්ඩුව බලය ගත්තේ තවත් දේශපාලන පක්ෂයක් වගේ අවුරුදු කීපයක් ඔහේ ඉඳල යන්න නෙවෙයි. අපිට දැක්මක්, අරමුණක්, ඉලක්කයක් තියෙනවා. අපි ටිකෙන් ටික පියවරෙන් පියවර ඒ වෙනුවෙන් තමයි කටයුතු කරන්නේ. අපිට ආරම්භයේදීම කරන්න සිද්ධ වුණේ එක් අතකින් වැටී තිබුණු ආර්ථිකය ස්ථාවර කරලා ජනතාවට සහන ප්‍රමාණයක් දෙන්න. අපි ඒක කළා.

ඉදිරි කාලයේ ආණ්ඩුව ඉලක්ක සහගතව වැඩ කරනවා. දැනටමත් ආරම්භ කර තියෙන ව්‍යාපෘති 'ක්ලීන් ශ්‍රී ලංකා', 'ප්‍රජා ශක්ති', 'රට ඩිජිටල්' කරණය කිරීම වැනි දේවල් සිදුවෙනවා. ඒ වගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ලබන වසරේ ආරම්භ කරනවා. රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය ක්‍රමවත් කිරීමටත් කටයුතු කරනවා. මාර්ග පද්ධතිය දියුණු කිරීම, ප්‍රවාහනයේ නව විප්ලවයක් ඇති කිරීම, සෞඛ්‍ය සේවය දියුණු කිරීම, අධිකරණ පද්ධතිය දියුණු කිරීම, කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම වගේ ඉලක්ක එක්ක රටේ ගැඹුරු සමාජ ආර්ථික පරිවර්තනයක් වෙනුවෙන් අපි වැඩ කරනවා. දේශපාලකයන් වෙනුවෙන් නොව ජනතාව වෙනුවෙන් කැපවෙන පාලනයක් අපි බිහිකරලා තිබෙනවා.

ඒ වගේම ජාතික පුනරුදයක් මේ රටේ ඇති කළ යුතුව තියෙනවා. අපිට සමාජයේ ලොකු වෙනසක් අවශ්‍යයි. ඒක තමයි අපේ අරමුණ. ඉතින් ඉදිරි කාලය තුළ ආණ්ඩුව ජනතාවට පොරොන්දු වූ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" සැබෑවක් කිරීම වෙනුවෙන් වැඩ කරනවා. අපේ රටේ ජනතාවත්, අපේ මහජන ව්‍යාපාරයත් එය වටහාගෙන ඒ සඳහා තම තමන්ගේ පැත්තෙන් ලබාදිය යුතු සහයෝගය ලබාදීම මෙහිදී අත්‍යාවශ්‍ය වෙනවා. අපි කාගෙත් වගකීම වෙන්නේ හොඳ වෙනස්කම් වෙනුවෙන් වෙනස් වීමයි.

# හරිත බලශක්ති...

6 පිටුවෙන්..

මීට අමතරව යුරෝපා සංගමයද 2023දී චිලී රාජ්‍ය සමග අමුද්‍රව්‍ය හවුල්කාරීත්වය සඳහා ගිවිසුම්ගතව ඇත. ආර්ජන්ටිනාව සමගද එවැනිම ගිවිසුම්වලට එළඹ ඇත. මීට අමතරව ජර්මනිය (වාහන නිපදවන සමාගම්) සහ ප්‍රංශයද මෙම කලාපය තුළ ඍජු ආයෝජන සඳහා එළඹෙමින් සිටියි. මීට අතරව බොලීවියාවේ ලිතියම් සඳහා රුසියාව දැවැන්ත ආයෝජන සිදුකරමින් ඇත. රුසියානු රාජ්‍ය පරමාණුක බලශක්ති සමාගම ඉන් ප්‍රධාන තැනක් ගනී. මීට අමතරව විදුලි වාහන නිපදවීමේ ප්‍රමුඛයින් ලෙස ජපානය, ද.කොරියාව සහ ඉන්දියාවද ක්‍රමයෙන් මෙම කලාපයේ ආයෝජන සඳහා මැදිහත්වෙමින් සිටියි.

අධික ලෙස ලිතියම් නිස්සාරණය කිරීම නිසා මෙම කලාපයේ පාරිසරික අර්බුදයන්ද උග්‍රවෙමින් ඇත. 'The Green Paradox' (හරිත පරස්පරතාව) නමින් මෙය හඳුන්වනු ලබන්නේ, ලෝක බලවතුන් පරිසර හිතකාමී සංවර්ධනයක් පදනම් කරගනිමින් පරිධියේ රටවල සිදුකරන පරිසර විනාශය පදනම් කරගනිමිනි. ජල මූලාශ සිඳීයාම මෙම අර්බුදයේ ප්‍රධාන කොටස වේ. සාමාන්‍යයෙන් ලිතියම් ටොන් එකක් නිස්සාරණය කිරීම සඳහා ජල ලීටර් මිලියන 02කට ආසන්න ප්‍රමාණයක් වැයවේ. ඇටකාමා කාන්තාරය පවා පිහිටා ඇති, ලොව වියළිම කාලපයක් වූ මෙම කලාපයේ මෙතරම් ජල ප්‍රමාණයක් වාෂ්පකර හැරීම නිසා කලාපයේ භූගත ජල මට්ටම ශීඝ්‍රයෙන් පහළ බසිමින් ඇත. එමෙන්ම නිස්සාරණයෙන් පසු ඉතිරි වන රසායනික, ඛනිජ ද්‍රව්‍ය සුළං සමග මුසුවීම නිසා කෘෂිකාර්මික බිම් දූෂිත තත්ත්වයට පත්ව ඇත. මෙම තත්ත්වය නිසා කලාපයේ ජෛව විවිධත්වයට දැඩි ලෙස බලපෑම් එල්ලවී තිබේ. පාරිසරික තත්ත්වයන් මත සිය ජීවනෝපායන් සකසාගත් මෙම කලාපයේ වෙසෙන ආදිවාසී ජනතාව, ලිතියම් නිස්සාරණයට එරෙහිව දැඩි විරෝධතා සිදුකිරීමට මෙම පාරිසරික විනාශයන් පාදක වී තිබේ.

ඉහත සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ ඛනිජ තෙල්වල සිට හරිත බලශක්තිය කරා සිදුවන බලශක්ති පරිවර්තනය යනු හුදෙක් බලශක්ති පරිවර්තනයක් පමණක් නොව පවතින ලෝක ආර්ථික, දේශපාලන තත්වයන්ද පරිවර්තනයට ලක්කරන්නක් වන බවය. ලෝක බලවතුන් මෙන්ම ලිතියම් හිමි රටවල් අද තරග වැදී සිටින්නේ එම පරිවර්තනය තුළ තමන් සතු බලය තවදුරටත් රැකගැනීම හෝ තවදුරටත් බලය වර්ධනය කරගැනීම අරමුණු කරගනිමිනි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




නව චීන තානාපති සහ ජවිපෙ ප්‍රධාන ලේකම් අතර හමුවක්



ඉන්දියානු මහ කොමසාරිස් සහ ජවිපෙ ප්‍රධාන ලේකම් අතර හමුවක්



Global Conscious Food Systems සමුළුවට සහභාගී වීමට භූතානයේ නිල සංචාරයක නිරත වෙමින්



තායිලන්ත තානාපතිවරයා සමඟ විශේෂ සාකච්ඡාවකට එක්වෙමින්



පැල්මඩුල්ලේදී පැවැති "Gem City Ratnapura 2026" අන්තර්ජාතික මැණික් ප්‍රදර්ශනයට එක් වී



ශ්‍රී ලංකාව සහ සර්බියාව අතර ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමට එරට සංචාරයකට එක්වෙමින්

## ෆිදෙල් 100 වැනි ජන්ම දින සමරුව ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී...

# රට වෙනස් කිරීමේදී ෆිදෙල් සහෝදරයාගෙන් ගත යුතු ආදර්ශ රැසක් තිබෙනවා

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා නායකයෙක් හැටියට, මනුෂ්‍යයෙක් හැටියට, කොමියුනිස්ට්වාදියෙක් හැටියට කියවා ගෙන ආදර්ශයට ගත යුතු තැන් බොහෝමයක් තිබෙනවා. නූතන විප්ලවීය කියුබාව ගොඩනගන්න නායකත්වය දුන්නේ ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා. ගෙවී ගිය වසර 60කට වැඩි කාලයක් තිස්සේ කියුබානුවන් මත පනවා තිබෙන අතිශය අමානුෂික සම්බාධක නිසා අදටත් දැඩි දුෂ්කර තත්වයක් යටතේ ඉන්නවා. මේ කාලය වන විට අතිශය අමානුෂික සම්බාධක වැඩිකර තිබෙන අතර, උදව් කළ රටවල් අඩුවෙලා තිබියෙදී ආහාර, බෙහෙත්, ඉන්ධන හිඟ වී තිබෙන පසුබිමකත් කියුබානු ජනතාව තමන් දිනා ගත් නිදහස අත්නොහැර සිටිනවා. මේ තත්වය ඔවුන්ට හුරු කළේ ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයායි. ඔහු කීවා "අපි මොනම දෙයකටවත් විප්ලවය හුවමාරු කරන්නේ නෑ" කියලා. දිනා ගත් නිදහස ආරක්ෂා කර ගන්න දරා ගැනීම් කරමින් කැපකිරීම් කරන ආකාරය සමස්ත රටේ ජනතාවටම උගන්වන්න තරම් දැනුමක් තිබූ සහ ආදර්ශ දුන් නායකයෙක් තමයි ෆිදෙල් සහෝදරයා.

සමහර රටවල කුඩා දුෂ්කරතා එනකොටත් ජනතාව කලබල වෙනවා. පවතින පාලනය දූෂිත, ජනතාවට පීඩාකාරී අත්තනෝමතික එකක් නම්, ඊට එරෙහිව ජනතාව සටන් කරන්න ඕනෑ. නමුත් රටක පවතින්නේ ජනතාවාදී පාලනයක් නම්, අලුත් යුගයක් නිර්මාණය කරන පාලනයක් නම්, එවැනි ගමනක් යද්දී ඇති වන දුෂ්කරතා එක්ක පොරබදමින් තමන් දිනා ගත් දේ ආරක්ෂා කර ගන්නා ජනතාවක් සිටිය යුතුයි. අපේ රටෙත් මැතිවරණ ජයග්‍රහණයකින් ආණ්ඩු බලයක් අපි පිහිටුවා තිබෙනවා. බැටිස්ටාගේ ඒකාධිපති පාලනය යටතේ මැතිවරණ අහෝසි කර තිබුණු නිසා ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා ඇතුළු පිරිස බලය ගත්තේ සන්නද්ධ අරගලයකින්. බැටිස්ටාගේ දූෂිත ඒකාධිපති පාලනය වෙනස් කරන්න ෆිදෙල් කැස්ත්‍රෝ ඇතුළු පිරිසට හැකි වුණා වගේ අපේ රටේ දූෂිත පවුල් පාලනය වෙනස් කරන්න ජනතාවගේ ඡන්දයෙන් හැකි වුණා. බලය ගැනීමේ ආකාර වෙනස් වුණත් අපි දෙරටම අලුත් සමාජයක් නිර්මාණය කරන්න ක්‍රියාකරමින් සිටිනවා. තමන් දිනා ගත් අත්නොහැර නව සමාජයක් ගොඩනැගීමේ වගකීම අත්නොහැර දරාගෙන ඉන්න කියුබානු ජනතාවට අපි අපේ ගෞරවය හා ආචාරය පුද කර සිටිනවා. ඒ වගේම එරට ජනතාවට නායකත්වය ලබා දෙන ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා නිර්මාණය කළ කොමියුනිස්ට් පක්ෂය අපිත් සමග සම්බන්ධතා පවත්වනවා.




මේ මොහොතේ අපට වැදගත් වන ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයාගේ ආදර්ශ කිහිපයක් ගැන සලකා බැලීම වැදගත්. ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා සතුව තිබුණු නායකත්ව ගුණාංග කිහිපයක්


11 පිටුවට


# ජනතා මුදලින් හැදෙන ස්ථාන තමන්ගේ තැනක් ලෙස ජනතාවට දැනිය යුතුයි

### ප්‍රවාහන මහාමාර්ග හා සිවිල් ගුවන් සේවා ඇමති බිමල් රත්නායක සහෝදරයා



තමන් ඉදිරියට එන්නේ බැද්දේගම සිළිඳුලා නොවන බවත් ඔවුන් රටේ ගෞරවනීය පුරවැසියන් බවත් එම නිසා යම් ආයතනයකට පැමිණ තම අවශ්‍යතාවය අනුව ප්‍රධානියා මුණගැසිය හැකි ආකාරයට ආයතන සැලසුම් විය යුතුව ඇති බවත් පෙන්වා දුන් ප්‍රවාහන මහාමාර්ග හා සිවිල් ගුවන් සේවා ඇමති බිමල් රත්නායක සහෝදරයා, මිනිසුන්ගේ මුදල්වලින් මිනිසුන්ගේ ආණ්ඩුවකින් ඉදිකිරීම් සිදු වන නිසා එවැනි ස්ථාන තමන්ගේ තැන් ලෙස ජනතාවට දැනෙන ආකාරයේ පරිසරයක් නිර්මාණය විය යුතු බව අවධාරණය කළේය.

බිමල් රත්නායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 28වැනි දින සෙත්සිරිපාය තුන්වැනි අදියර ඉදිකිරීමේ සමාරම්භක අවස්ථාවට එක්වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ බිමල් රත්නායක සහෝදරයා මෙසේද පැවසීය.

අවුරුදු තුනකට වඩා කාලයක් අත්හැර දමා තිබූ ජාතික සම්පතකට ජීවය ලබාදෙමින් ජනතාවට, ආර්ථිකයට සේවය ලබාදීමට, ආරම්භ කරන දවසක් අද. මේ ගොඩනැගිල්ල සම්බන්ධව අපි නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කිරීමේදී අති විශාල මුදලක් වැය වන බව දැන ගන්න ලැබුණා. කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවකදී, හිටපු බලශක්ති ඇමති, ජයකොඩි ඇමතිතුමා ගොඩනැගිල්ලක් අවශ්‍ය බව දන්වා සිටියා. නමුත් බත්තරමුල්ල කෝට්ටේ ප්‍රදේශය ප්‍රධාන පරිපාලන නගරය තිබෙන අතර පැලියගොඩ සහ අනෙක් පැත්තෙන් රත්මලාන පැත්තේ උප පරිපාලන නගර දෙකක් ගොඩනගන්න කරුණු සොයා බලන්න කල්පනා කළා. කොල්ලුපිටියේ ඉඳලා මොරටුව දක්වා විදුලි දුම්රිය ඇතුළු ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කර තිබෙනවා. ඒ අතර තිබෙන ස්ටේෂන් හුදෙක් ස්ටේෂන් විතරක් නොවෙයි, කාර්යාල සහ ව්‍යාපාරික නගර වශයෙන් ඉදිකෙරෙනවා. 2027 වසරේ මැද වන විට විදුලි දුම්රිය කටයුතු ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා.

මේ විදිහට උප පරිපාලන නගර දෙකක් ඉදිවෙනකොට බත්තරමුල්ලට තිබෙන පීඩනය අඩුවී ඒ දෙපැත්තටත් ජනතාව බෙදෙනවා. අනෙක් පැත්තෙන් පෝර්ට් සිටියේ ඉඳලා මොරටුව දක්වා මෙරීන් ඩ්‍රයිව් ව්‍යාපෘති දෙකක් සැලසුම් කර තිබෙනවා. ඊට අමතරව ගාලු පාර ආශ්‍රිතව කලින් ඉඳලා කෙරුණු සංවර්ධන ව්‍යාපෘති තවදුරටත් වේගවත් කරන්න සැලසුම් කර තිබෙනවා. අවුරුදු තුනක් හතරක් වගේ කාලයක් ඇතුළත ගාලු පාර ආශ්‍රිතව සහ පැලියගොඩ ආශ්‍රිතව උප පරිපාලන නගර ඉදිකිරීමෙන් බත්තරමුල්ලට තිබෙන පීඩනය අඩු කර, අවශ්‍යතාවය අනුව තවත් ස්ථානයක් තෝරා ගන්න කල්පනා කරනවා. රාජ්‍ය දෙපාර්තමේන්තු තුනකින් ඉතාම බරපතළ වගකීමක් අරගෙන තිබෙන නිසා, අවුරුදු තුනක් ඇතුළත මේ ඉදිකිරීම් අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. පරණ බිත්තිවලින් වටවූ කුඩු වගේ අඳුරු ආකෘතියෙන් එළියට එන්න ඕනෑ.

# අපි මලයගම් ප්‍රජාවට ලබා දෙන්නේ ගෙයක් පමණක් නොව අභිමානවත් ජීවිතයක්

### වැවිලි, වතු යටිතල, ප්‍රජා පහසුකම් ඇමති සමන්ත විද්‍යාරත්න සහෝදරයා



ගෙවී ගිය වසර දෙසීයක කාලය තුළ මලෛයගම් ජනතාව දහඩිය, ශ්‍රමය, කඳුළු සහ ජීවිත වැය කළේ මාතෘ භූමිය සරුසාර කිරීමට බව මතක් කර දුන් වැවිලි, වතු යටිතල, ප්‍රජා පහසුකම් ඇමති සමන්ත විද්‍යාරත්න සහෝදරයා, බොහෝ දෙනෙකුට නිවාසයක් ලබාදීම හුදු ගෙයක් ලබා දීමක් ලෙස හැඟී ගියද මලෛයගම් ප්‍රජාවට නිවසක් ලැබීම යනු අභිමානය, අයිතිය, ආරක්ෂාව සහිත ජීවිතයක් ලබාදීම බව ප්‍රකාශ කළේය.

අමාත්‍ය සමන්ත විද්‍යාරත්න සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 28වැනි දින පූනාගල, කබරගල නිවාස ව්‍යාපෘතිය ජනතාවට පවරාදීම වෙනුවෙන් පැවති උත්සව සභාව අමතනමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සමන්ත සහෝදරයා මෙසේද කියා සිටියේය.

අපි අද උපරිම සතුටක් ලබන දවසක්. අද නිවාස හිමිකම් ලබන පවුල් 50ක සාමාජිකයන් 2023 මාර්තු 19වැනිදා ඇති වූ නාය යාමෙන් ලයින් කාමර අහිමි වූ අයයි. ඒ අය දිරාගිය තේ කර්මාන්ත ශාලාවක අනාථ කඳවුරක වැසියන් ලෙස මේ දක්වා ජීවත් වුණා. අපේ අමාත්‍යාංශයේ පළමුවැනි කාර්යය හැටියට කැබිනට් මණ්ඩලයට යෝජනා කළේ ආරක්ෂක අමාත්‍යාංශයත් සමග සාකච්ඡා කර, කඩිනමින් මේ නිවාස ව්‍යාපෘතිය ඉදිකරන්නයි. ඉතා කෙටි කාලයක් තුළ හොඳම ප්‍රමිතියෙන් ඉතා අලංකාර ලෙස මේ නිවාස ඉදිකර දීම පිළිබඳව යුද හමුදාවට ස්තුතිවන්ත වෙනවා. 200කට ආසන්න හමුදාවේ සහෝදරවරු මේ ව්‍යාපෘතිය වෙනුවෙන් මහන්සි වුණා. ඒ හැමෝටම අද ඉතාම සතුටුදායක දවසක්.

ජනාධිපතිතුමනි, ඔබතුමා ජනාධිපති වීමට පෙර 2023 හැටන්වලදී ඓතිහාසික "හැටන් ප්‍රකාශය" සිදු කළා. මලෛයගම් ප්‍රජාව ලංකාවට ඇවිත් වසර 200ක් පිරීම නිමිත්තෙන් ඒ ප්‍රකාශය නිකුත් කළා. මේ වන විට ඔවුන් ඇවිත් වසර 203ක් වෙනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ගිය අවුරුද්දේ තේ අපනයනයෙන් ඩොලර් බිලියන 1.5ක ආදායමක් උපයාගෙන තිබෙනවා. මේ මුදල අවුරුදු 200ක් වෙනුවෙන් ගණන් බැලුවොත් ඩොලර් බිලියන 300ක් ලංකාවට ගෙනත් දී තිබෙනවා. ඒ ඩොලර් යොදවලයි මේ රටට බෙහෙත්, පොහොර ගෙනත් සිංහල, දෙමළ, මුස්ලිම් සියලුම දෙනාගේ අවශ්‍යතා සැලසුවේ. නමුත් ඒ කාලය පුරාම මේ ජනතාවට තමන්ගේ කියලා ගෙයක් තිබුණේ නැහැ. ලිපිනයක් තිබුණේ නැහැ. ඔවුන් ජීවත් වුණු ලයිම වතු සමාගමට අයිති වී තිබුණා. ඔවුන්ට ලියුම් ආවේ වතු අධිකාරිගේ නමට.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.